## <u>තිරප්පනේ ප්‍රාදේශීය සභාව</u>

## <u>2022.05.24 වන දින පෙ.ව 10.00ට පැවති මහ සභා රැස්වීම</u>

***<u>පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:</u>***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා - ගරු සභාපතිතුමා
2. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු සභික තුමා
3. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
4. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
5. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
6. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
7. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
8. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
9. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය
10. ඒ.ජී.මරියහාමි මැතිනිය - ගරු සභික තුමිය
11. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
12. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා
13. ජේ.රෝහන විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා
14. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***<u>නොදන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :</u>***

1. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභික තුමා

***<u>සහභාගී වූ නිළධාරීන් ;</u>***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය ලිපිකරු

**<u>(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.</u>**

**- <u>2022.04.19 දින පැවති ගරු මහා සභා වාරයේ වාර්තාව සහා සම්මත කිරීම.</u>**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.04.19 දින පැවති ගරු මහ සභා වාර්තාව සහා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් , පසුගිය සභා වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහා සභාවට ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 82 - 05-2022.</u>**

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි,ගරු මහා සභාවෙන් අවසරයි. 2022.04.19 දින පැවති ගරු මහා සභා වාර්තාවේ සංශෝධනයක් තියෙනවා යෝජනා අංක 79 - 04-2022 හි බහුතර එකඟතාවයෙන් සහා සම්මත වුනා කියලා. ඒක විරෝධතාවයට යටත්ව සහා සම්මත වුනා කියලා සඳහන් කරන්න.එම සජශෝධනයට යටත්ව පසුගිය සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරමි.වෙනත් සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.

පසුගිය සභා වාරයට කලින් මහ සභාවට ඉදිරිපත් කර ලිපියක් පසුගිය සභා වාරයට ඉදිරිපත් කරලා අනුමත කරගෙන තියෙන නිසා ප්‍රාදේශීය සභාවේ 13.1 රීති වලට අනුව පසුගිය සභා වාර්තාව වැරදි එක්ක් බවට ප්‍රකාශ කරමි.මම ඒ සඳහා මාගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.

සභාවේ එකඟතාවය මත තමයි එම ලිපිය මහ සභාවට ඉදිරිපත් කලේ.

ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.

මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඉදිරිපත් කරාට රීතිප්‍රකාරව එය වැරදියි.

ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.

ඔබතුමා කියන දේ නිවැරදියි. රීති ප්‍රකාරව වැරදි වුනත් පරිසර කමිටුවේ මන්ත්‍රීවරුන්ගේ සහ අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත තමයි එය න්‍යාය පත්‍රයට ඇතුළත් කලේ.ව්‍යාපති ක්‍රියාත්මක කිරීමේදී අමුද්‍රව්‍ය හිඟ කම හා අමුද්‍රව්‍ය මිළ ඉහල යාම නිසා තමයි මෙම ලිපිය සභාවට ඉදිරිපත් කිරීම සිදුවුයේ බළප්‍රදේශයේ ජනතාවගේ පැත්තෙන් හිතලා තමයි අපි මේ තීරණයට එළඹුනේ.

ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.

මගේ ගැටළුව තමයි ප්‍රාදේශීය සභාවේ රීති අවශ්‍ය නැත්ද මේ සභාවට රීති වලට පිටින් අපට සභාවේ කටයුතු කරන්න බෑ.

ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.

මම ඒකට සීයට සීයක් එකඟ වෙනවා.බළප්‍ර දේශයේ ව්‍යාපෘති නතර වෙලා ,මහජනතාවට විශාල පාඩුවක් වන නිසා මම නැවත ඉදිරිපත් කරේ.

ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා

සභා වාර්තාවේ තවත් සංශෝධනයක් තියෙනවා .1987 අංක 15 වෙන්න ඕන

ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා

සංශෝධන සහිතිව සම්මත කිරීමට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 අප්‍රේල් මස 19 වන දින පැවති ගරු මහා සභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

(ආ) ගරු සභපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

විශේෂ නිවේදන යටතේ මට කියන්න තියෙන්නේ දැනට රටේ පවත්නා ආර්ථික තත්වයත් සමඟ නගර පවිත්‍රතා කටයුතු සීමා කිරීමට සහ භාහිර වැඩ කටයුතු සීමා කරලා සභාව පවත්වාගෙන යාමට සිදුවෙලා තියෙනවා ඉන්ධන මිළ ඉහළ යාමත් සමඟ සභාව මූල්‍ය අර්බුධයකට ලක්වෙලා තියෙනවා මිනිස්සුන්ට බදු ගෙවාගන්න බෑ.මේ තත්වයත් සමඟ උලගල්ල හෝටලය විසින් අද දින යම් කිසි මුදලක් සභාවට ගෙවන්න එකඟ වුනා.එතකොට

අපට යම් සහනයක් ලැබේවී.ප්‍ර දේශයේ සමහර මිනිස්සු ඉතා අපහසුවෙන් ජීවත් වෙන්නේ.පෞද්ගලිකවත් මට ඒ සම්බධයෙන් කථාකරනවා.ඒ නිසා මම ඔබ තුමාලගෙන් ඉල්ලා සිටින්නේ මහජනාතාවට හැකි ආකාරයේ උදව්වක් ලබා දෙන්න කියලා

**(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.**

- ඒ අනුව ආදායම් පරීක්ෂක මහත්මා විසින් 2022 අප්‍රේල් මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව අප්‍රේල් මස ආදායම ලෙස රු.463,834.15 ක මුදලක් ආදායම් පරීක්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද මම දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ගිය වර සභාවාරයදී සේවකයින් දෙදෙනෙකුගේ නොපැමිණීම සම්බන්ධයෙන් මෙම සභා වාරයේදී නිදහසට කරුනු ඉදිරිපත් කරන ලෙස දැන්වූවත් මේ සභාවට එය ඉදිරිපත් වෙලා නෑ මේ දෙන්නා ස්ථාන මාරු කරලත් නෑ සභාවට කරුණු ඉදිරිපත් කරන ලෙස ලිපියකින් හෝ එම දෙදෙනාට දැනුම් දීලා නෑ.මේ ලගදී පළාත් පාලන දෙපාර්තමෙන්තුවෙන් එනකොටත් ඒ දෙදෙනා එතෙන ඉදලා නෑ.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මම මේ පිළිබඳ සමාව අයදිනවා නියත වශයෙන්ම ලබන සභා වාරයට කරුණු වාර්තා කරන බව මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

සභාපති තුමා කවුද මේ සේවකයින් දෙදෙනා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අජිත් වනසිංහ සහ නිජාබ්දීන් මෙම දෙදෙනො ඇවිල්ලා කලින් ගහිල්ලා තියෙන්නේ .මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමර්ශනයක් කරනවා කිව්වා.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් නොමැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2022 යටතේ නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක වීම සඳහා අනුමත වී ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමි.

**<u>යෝජනා අංක 83 - 05-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -නාසීම් මැතිතුමා.</u>**

සුභ උදෑසනක් සියළු දෙනාගෙන්ම අවසරයි.ඉහත සභාවට ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් ව්‍යාපෘති කඩිනමින් ගිවිසුම් අත්සන් කර ව්‍යාපෘති ආරම්භ කිරීම සුදුසු බව මම යෝජනා කරමි.

.........................................................................................................................................

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක 02.**

ගම සමඟ පිළිසඳරක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2022 යටතේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක වීම සඳහා අනුමත වී ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -නාසීම් මැතිතුමා</u>**

ගරු සභාපති තුමනි මෙම ව්‍යාපෘති සම්බන්ධව මම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගිහින් කතා කලා දැනට මෙම ව්‍යාපෘති තාවකාලාකව නවත්තලා තියෙන්නේ මම හිතුවේ නැවත සංශෝධනය කරලා සභාවට ඉදිරිපත් කරලා තියෙන්නේ කියලා ඒකයි මම සභාවට යෝජනා කලේ.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මමසත් හිතුවේ මේක අවසන් ව්‍යාපෘති දෙකක් කියලා ඒකයි මම සභාවට ඉදිරිපත් කලේ.මම නැවත පරික්ෂා කිරීමක් සිදු නොකල නිසා සිදු වූ වරද සම්බන්ධයෙන් ගරු මහ සභාවෙන් සමාව ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා</u>**

සභාපති තුමනි මෙවැනි ව්‍යාපෘති න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී ව්‍යාපෘති නාමය සමඟ ඉදිරිපත් කිරීම සුදුස බව මම ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය*

**<u>ලිපි අංක - II</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

NCP PF 5497 කැබ් රථය සේවා කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 84 - 05-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

මෙම වාහනය සභාව සතු වාහනයක් නිසාත් අදාල දුර ප්‍රමාණ ධාවනය කර ඇති නිසාත් මෙම රථය සේවා කිරීම අත්‍යවශ්‍ය නිසාත් මෙය සේවා කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - IV</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ගල්රෝල සඳහා වැඩිපුර ලෙවූ මුදල් ආපසු ලබා ගැනීම සම්බද්ධයෙන් ආර්ගපීගකේ රත්නායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 85 - 05-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු මහ සභාවෙන් අවසරයි.ඇත්තටම කාර්මික කමිටුව ලිපි නැතිව අවස්ථා 02ක් පැවැත්වූවා.කාර්මික කමිටුවට ලියුම් ආවෙ නෑ.විෂය ලිපිකරුගෙනුත් අහපුවම ලියුම් නෑ කියනවා.නමුත් සභාවට ලියුම් එනවා. ඒ අනුව එම ලිපිය කමිටුවට යොමු කරන ලෙස මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - V</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවට අයත් වාහන / යන්ත්‍රෝපකරණ සඳහා අයකරන ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපිත් කරමි.

නමුත් ඊයේ දිනයේ ඉන්ධන ගාස්තු සංශෝධනය වුනා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි , මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාගෙන්ම අවසරයි. ඉන්ධන වියදම් ඉහළ යාම නිසාත් ඉන්ධන ලබා ගැනීමේ අවහිසුතා නිසාත් අද්දින සභාවේ යෝජනා සම්මත කලාට නැවත ගාස්තු ඉහළ යා හැකියි ආර්ථිකය යහපත් වන තුරු සංශෝධනය තාවකාලිකව නතර කරමු යන යෝජනාව මම සභාවට ඉදරිපත් කරමි.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

ඉන්ධන මිළි ගණන් ඉහළ යාම පමණක් සිදු කරමු.අනෙක් සේවා ගාස්තු සංශෝධනය නොකර ඉමු.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා</u>

තිස්ස මන්ත්‍රී තුමා ගෙන ආ යෝජනාවට මහම එකඟ වෙමි.මෙම සංශෝධනය තාවකාලිකව නතර කරමු.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

වාහන ධාවනය කරන එක නවත්වන්න පුලුවන් නමුත් ජල විදුලි බිල්පත් සහ සේවකයන්ගේ පඩි නඩි ගෙවීමේ ගැටළු තියෙනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>යෝජනා අංක **86 - 05-2022.**</u>

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා</u>

පවතින තෙල් මිලට යටත්ව යන්ත්‍ර සූත්‍ර මිළ ගණන් සංශෝධනය සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා</u>

සභාවේ වියදම් පියවා ගන්නේ මෙම යන්ත්‍ර සූත්‍ර කුලියට දීම නිසා එම නිසා පවතින මිළ ගණන් වලට යටත්ව මෙම මිළ ඉහළ දැමීම සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව සුදුසු බවට මම ප්‍රකාශ කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා</u>

එස යෝජනාව මම ස්ථිර කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක VI**

තාක්ෂණික නිළධාරී නැවත එම ස්ථානය පරික්ෂා කර යුතු බවට දන්වලා තියෙනවා ඒ අනුව පරික්ෂා කර බලා ඊලග මහ සභාවට ඉසිරිපත් කිරීම සුදුසුයි

**යෝජනා අංක 87 - 05-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

පසුගය දවස් වල කෘෂිකර්ම දේපාරතමේනතුව සහ රජය ඒකාබද්ධ වෙලා කරපු ව්‍යාපෘතිය අසාර්ථක වුනා ගොඩක් මිනිස්සු කාබනික පොහොර නිශ්පාදනය කරලා ආර්ධක වුනා.මෙවැනි ව්‍යාපෘති වල යටි අරමුණ ඉඩම් අත්පත් කර ගැනීමය එබැවින් මෙම ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීම නුසුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක VII**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා**

තාක්ෂණික නිළධාරී නැවත පරික්ෂා කරන්න කිලයා සටහන් කරලා තියෙනවා. පරිසර කමිටුවේ සභාපති තුමා බැලුවද

**ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා**

මම ගිහින් ග්‍රාමනිළධාරී සමඟ සාකච්ඡා කලා මහජන විරෝධතාවයක් නෑ කිව්වා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා**

බොරළු වලවල් සම්බන්ධයෙන් මාස කිහිපකට කලිනුත් මම කතා කලා ආයෙත් නැවත වතාවක් ලිපි එවලා තියෙනවා.කුඩා කණුමුල්ල පැත්තේ කාබනික පොහොර එදනවා කියලා පටන් ගත්තා දැන් හදන්නේ නෑ.බොරළු වලවල් වල ප්‍රවණතාවය සභාවක් විදියට තේරුම් ගන්න.වැව් වලග තියෙන පස් හාරනවාෑ අපට බොරළු මෙච්චර කපන්න මෙච්චර පාරවල් තියෙනවද.එක පාරකට බොරළු කොපමණ ප්‍රමාණයක් අවශ්‍යද කියලා අපට සංගණනය කරන්න පුලුවන්.මේක දගින් දිගට යනවානම් අපට කරන්න පුලුවන් දේ අපි ඉදිරියේදී කරනවා

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

සභාපති තුමා ග්‍රාම නිළධාරී තහවුරු කලත් අපි අනුමැතිය නොදී හිටපු අවස්ථා තියෙනවා ඒ නිසා ග්‍රාම නිළධාරීන්ගේ අහන්න එපා ස්වාධීන මිනිස්සුන්ගෙන් අහන්න.අනුමැතිය දුන්නට පස්සේ විරෝධතා ඉදිරිපත් වෙනවා නම් ඒක ගැටලුවක්.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා**

මධුර මන්ත්‍රීතුමා ඔබ තුමා ඉස්සෙල්ලා සභා වාරයේදී මේකට විරුද්ධ වුනා.ඊලග මාසේ වෙනකොට දෙන්න කියලා සභාවට ලිවුමක් ඉදිරිපත් කරනවා.මේකට එකපැතක්තෙන් දේශපාලනයත් සම්බන්ධයි.එක සභාවකදී විරුද්ධ වුන මන්ත්‍රී තුමා ඊලග සභාව වෙකොට එකඟයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රාජකරුණා මැතිතුමා**

මාසෙකට බොරළු අනුමැතිය එක්ක් හරි දෙකක් හරි දෙන්න.මේ බොරළු ගම් වල මිනිස්සුන්ට නෙමෙයි පිටපළාත්වලට තමයි යන්නේ.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා**

එකක් තිබ්බොත් බොරළු වල මිළ ගණන් ආසීමාන්තික විදියට ඉහල දමයි.එතකොට මිනිස්සු අත්තිවාරමක් වුනත් පුරවාගන්නේ කොහොමද ඒ නිසා ඊලට සභා වාරයට මෙම ලිපිය යොමු කරමු.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක VIII**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් නෑ කියලා තාක්ෂණික නිළධාරී සහ පරිසර කමිටුවේ නිර්දේශ ලබා දීලා තියෙනවා

**ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා**

මෙ සඳහා අනුමැතිය ලබා දෙන්න සුදුසු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා**

මේක වැලි නිස්සාරණය කරන ක්‍රම වේදය මොකක්ද කියලා බැලුවද

**ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා**

අපි මහජන විරෝධයක් තියෙනවද කියලා විතරයි බලන්නේ තාක්ෂණික නිළධාරී තමයි මේ පිළිබඳව සොයා බලන්නේ

**ගරු ප්‍රාදේශීය සභා සභික - අන්වර් සදාක් මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක IX**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා**

අංක 94,පතිරාජගම,තිරප්පනේ ලිපිනයේ පදිංචි එන්.එස්.වසන්ත සිල්වා යන අය විසින් අංක 550 සෙම්බුකුලම තුලානේ පිහිටි ඉඩම් කොටසකින් වැලි නිස්සාරණය සඳහා ඉ.කො.75 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා**

ගරු සභා පතිතුමනි,මම මේ සම්බන්ධව මිනිසුස්න්ගෙන් ඇහුවා.මහජන විරෝධතාවයක් නෑ කියලා කීවා.සෙම්බුකුලම එකට නම් මහජන විරෝධකාවයක් තියෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක X</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

ගල්වඩුවාගම, ගල්කුලම ලිපිනයේ පදිංචි ඒ.ඒ.එස්.වී.අංබසිංහ යන අය විසින් අංක 552 ඇතුන්ගම දකුණ තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, අපිටත් ප්‍රවාහන අපහසුතා තියෙනවා.මම කොම්පෝස්ට් එක නම් බලන්න ගියා..ඒත් මට කිසිම නිලධාරියෙක් හමුවුනේ නෑ.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

යන වේලාවට නිලධාරින් එක්කන් යන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

බලපු ටිකට සුදුසුනම් දෙමු.බලපු නැති ටිකට ලබන පාර බලලා දෙමු.පළමු කාරනය තමා කොට්ඨාශ මන්ත්‍රීතුමා මේකට වගකියන්න ඕන.සභාවේ නිරීණායක වලට පරිහාහිරව සුදුවෙනවානම් සභාවට ඉදිරිපත් කරලා අපි නතර කරමු.බොරළු කපන එකට නෙලිනිම විරෝදකාවය එන්නේ සභාවට.සමාජය මේ දිහා බලන්නේ වැරදි කෝණයකින්.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා</u>**

කපන්නේ වෙන කෙනෙක් වුනාට කොට්ඨාශ මන්ත්‍රීතුමාට තමයි චෝදනාව එන්නේ.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක XI</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

ඉදිගහවැව, එප්පාවල ලිපිනයේ පදිංචි එම්.රේණුකා දිසානායක යන අය විසින් අංක 554 පයින්ඩිකුලම තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

මේක පරිසර කමිටුවෙන් බලලා නැති නිසා ලබන මහ සභාවට යොමු කරමු.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක XII</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

අංක 53, කලවාන ,මීනුවන්ගොඩ ලිපිනයේ පදිංචි එල්.පී.සී.දිසානායක යන අය විසින් අංක 550 සෙම්බුකුලම තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා</u>**

මෙය ලබා දීම නුසුදුසු බව මම යෝජනා කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක XIII</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

ඉදිගහවැව, එප්පාවල ලිපිනයේ පදිංචි ආර්.එම්.පී.ඒ.එස්.ජයසිංහ යන අය විසින් අංක 547 ඉදිගහවැව තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා</u>**

මෙය ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක XIV</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

ඉහළ කලංකුට්ටිය , කලංකුට්ටිය ,ගල්නෑව ලිපිනයේ පිහිටි කැනෝලා කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් ඉංජිනියර්ස් යන ආයතනය විසින් අංක 547 ඉඳිගහවැව තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසකින් කළු ගල් කැනීම සඳහා ඉ.කො.78 බලපත්‍රයක් ලබා දීමට අවශ්‍ය නිර්දේශ ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

__ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා__

මෙය ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

__ලිපි අංක XV__

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා__

අංක 552 ඇතුන්ගම දකුන තුලානේ පිහිටි රජයේ ඉඩම් කොටසක් තුළ අක්කර 05 ක් පමණ බිම් කොටසක කාබනික පොහොර නිෂ්පාදනය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා රණ මයුර ප්ලාන්ටේෂන් පුද්ගලික සමාගම වෙත වානිජ කටයුතු යටතේ දීර්ඝ කාලීන බදු පදනම යටතේ බදු බලපත්‍ර ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

__ලිපි අංක XVI__

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා__

545 ඉහල අඹතලේ ග්‍රාම නිලධාරි වසම තුල ඉදිවන , ලංකා විදුලි මණ්ඩලය විසින් දියත් කර ඇති “ගමට බලාගාරයක්” සූර්යබල ව්‍යාපෘති හත් දහසේ (7,000) සූර්ය බල ව්‍යාපෘතිය සඳහා අවසර ලබා ගැනීම සඳහා කැකිරාව සෝලා පවර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර සිටිනවා.මේ සම්බන්ධව තාක්ෂණ නිළධාරී සහ පරිසර කමිටුව නිර්දේශ කර තිබෙනවා

__ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා__

වර්තමානයේ විදුලි නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා උචිතයි.මෙහිදි ගිවිසුම් කාලය අවසානයේදී ඉඩමේ අයිතිය රජයට පැවරෙනවාද? පුද්ගලික ඉඩම් නම් කිසි ගැටලුවක් නෑ

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා__

මේ ගැන මම සොයා බැලුවා මේවාඔක්කොම පෞද්ගලික ඉඩම්. ඉඩම් හිමියන්ට මාසයකට රුපියල් හතලිස්දාහසක මුදලක් සමාගම විසින් ගෙවනවා.

__ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.__

මින් ඉදිරියට මෙවැනි ලිපි න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේදී බිම් ප්‍රමාණය සහ ලිපින ඇතුළත් කරන්න.පුද්ගලික ඉඩම් වල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන නිසා කිසි ගැටලුවක් නැ රටේ විදුලි නිෂ්පාදන ක්‍රියාවලියටත් ඉතා සුදුසු බැවින් ඉහත සඳහන් යෝජනාව මම ස්ථිර කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක XV</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

තාක්ෂණික නිලධාරී වයි.අයි.අබේගුණසේකර මහතා විසින් ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා යාම වෙනුවෙන් ඉන්ධන ලබා ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිම.මීට පෙර තාක්ෂණික සහයකට ඉන්ධන වෙනුවෙන් මාසයකට රුපියල් 4000 ක් ලබා දුන්නා.මෙයාලට ගමන් වියදම් හිමි නමුත් ක්ෂේත්‍ර පරික්ෂාව සඳහා එය ප්‍රමාණවත් මදි කියලා තියෙන්නේ.වාහන නැති නිසා එයාලත් පෞද්ගලික වාහන වල තමා යන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපති තුමනි තාක්ෂණික නිළධාරීට සහ අනුරාධ මහතාට ක්ෂේත්‍ර පරික්ෂාව සඳහා ඉන්ධන ප්‍රමාණයක් ඉල්ලලා තියෙනවා.ලේකම් තුමිය,මේවා දෙන මාසේ ඉඳන් ගමන් වියදම් දෙන්න බැ මාසයකට ලීටර් 10 ක ප්‍රමාණයක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ලබාදෙන්නේ.ඒකේ අනුමැතිය ඊලඟ සභාවට ඉදිරිපත් කරන්න.ප්‍රගතියද අවශ්‍යායි.ලබන මාසේ සිට මෙම ඉන්ධන ප්‍රමාණය ලබා දීමට සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා</u>**

එම නිළධාරීන් දෙදෙනා පුද්ගලික වාහනයක යන නිසා ඒ ගැනත් සිතන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - රාජකරුණා මැතිතුමා</u>**

තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක XXIII</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා</u>**

2010 වර්ෂයේදි උතුරු මැද පළාත් සභාවෙන් ලද වටිනාකම රු.640,300.00 ක් වූ සහල් සැකසුම් මධ්‍යස්ථාන උපකරණ අයිතම කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ගබඩාව තුළ රඳවා ගෙන තිබෙන බව 2022.04.27 දිනැති සහකාර විගණකාධිපත්ගේ අංක ANP/F/TPPS/21/2022/11/ ( C ) දරණ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ගරු මහ සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කිරීම.මේක මාස 06 කට කලින් දාපු ලිපියක් මේක වෙන්දේසි කරන්න එකඟතාවයක් ආවේ නැ මේක වෙන්දේසි කරන්න කෙනෙක් හොයලා දෙන්න කිව්වට කවුරුත් හොයලා දුන්නැ මේ පිළිබඳ දිගින් දිගටම විගණන විමසුම් වන නිසා අපි තීන්දුවක් ගන්න ඕන මොකද මේක සභාවටත් හොඳනැ

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

මේක සභාවට මීට වසර 12 කට කලින් උතුරු මැද පළාත් සභාවෙන් ලබා දීලා තියෙන්නේ.නමුත් මේ වෙනකම් එක පාන් රාත්තකල්වත් හදලා නෑ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් සුදුසු කෙනෙක් හොයමු.ඒ නිසා ලබන සභා වාරය වන තුරු කල් ගනිමු .ලබන සභාව වන තුරු කෙනෙක් සොයන්න බැරි වුනොත් වෙන විකල්පයක් සොයමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යොජනාව ස්ථිර කරන අතරම අනිත් මන්ත්‍රී වරුන්ටද මේ පිළිබඳව අවදධානය යොමු කරන ලෙස මම ඩල්ලා සිටිනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා**

න්‍යාය පත්‍රයට අමතරව ලිපි වගයක් තියෙනවා එම ලිපි ඉදිරිපත් කිරීම සඳහා ගරු මහ සභාවෙන් අවසර ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා**

අමතර ලිපි ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය සභා පනතට අනුකූල නෑ මේක අනිත් මන්ත්‍රීවරුන්ට ගැටලුවක් නෙමෙයිද?

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

අමතර ලිපි සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මමත් විරුද්ධ වෙනවා. ඊයේ තිබුන කාර්මක කමිටුවේදි තමා අපි කීවේ මේ ලිපි වැදගත් සහ ඉක්මනින් තීන්දු ගත යුතු බැවින් මහා සභාවට ඉදිරිපත් කරන්න කියලා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක XV**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ පහත නම් සඳහන් සේවකයන්ගේ 2022 මැයි මාසයට අදාළ අතිකාල දීමනා තක්සේරු වාර්තා අනුමත කර ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

| අනු අංකය | නම | තනතුර | 2022 මැයි මස ඉල්ලුම් කරන අතිකාල පැය ගණන |
|---|---|---|---|
| 01 | එස්.ජී.පී.කාවින්දි මෙය | කළමණාකරණ සේවා නිලධාරි | 30 |
| 02 | ආර්.එම්.කේ.චන්ද්‍රසිරි මෙය | ගිණුම් සහකාර | 40 |
| 03 | අජිත් කුමාර වනසිංහ මයා | මුරකරු | 75 |
| 04 | සී.බී.දිසානායක මයා | මාර්ග කම්කරු | 75 |
| 05 | දිනේෂ් සංජය රුද්‍රිගු මයා | මාර්ග කම්කරු | 75 |
| 06 | ජේ.කුමාරසිංහ මයා | මාර්ග කම්කරු | 75 |

| | | | |
|---|---|---|---|
| 07 | ජේ.එස්.ප්‍රියංකර මයා | සෞඛ්‍ය කම්කරු | 75 |
| 08 | එම්.බී.නිජාබ්දීන් මයා | සෞඛ්‍ය කම්කරු | 75 |

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

සියළු දෙනා දන්නවා රටේ දැනට පවතින තත්ත්වය ඉස්සරහට එන කාලය අවධානම් සහිත කාලයක් මෙම අතිකාල ඉල්ලීම් ලිපියේ නිජාබ්දීන් සහ වනසිංහ මහතා අතිකාල ඉල්ලීම් කරලා තියෙනවා.මේ දෙදෙනා මේ වෙනකම් නොපැමිණීම සම්බන්ධයෙන් සභාවට කරුණු ඉදිරිපත් කරලා නෑ අතිකාල ගෙවලා වාහන ඉන්ධන වියදම් ගෙවලා සභාව නඩත්තු කරන්න පුලුවන්ද කියන එක ප්‍රශ්නයක් මේ ඉල්ලලා තියෙන පැය ගණන සීයට පනහකින් අඩු කරලා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා**

රටේ දැනට පවතින ප්‍රශ්නය ඇති කලේ සේවකයෝ නෙමෙයි.ඒ නිසා මගේ අදහස නම් සීයට පනක් අඩු කරන්නේ නැතිව පැය ප්‍රමාණය අඩු කරන්න කියලා

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක XV**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අනියම් සේවකයින්

සභාවේ පවතින මූල්‍ය අර්බුධව නිසා පඩි නඩි ගෙවීම ගැටළුවක් නිසා තමයි මේ තීරණයට එළඹුනේ.මෙම සේවකයින් ස්ථිර කිරීමට ආසන්න මට්ටමේ සිටින නිසා ඉවත් කරන්නත් බෑ සතියට දින තුනක් වැඩ කරන විදියට තමයි හදලා තියෙන්නේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපති තුමනි මේ තීරණය සම්බන්ධයෙන් සියළුම සේවකයින් දැනුවත් සියළුම අනියම් සේවකයින් සම්බන්ධයෙන් කිව්වට සියළු දෙනාගේ නම් මේකේ ඇතුළත් නෑ

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

පෙර පාසල් සහයිකා මේකට ඇතුළත් නෑ අනිත් සියළු දෙනාම දින තුනයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

මේක අපි කැමැත්තෙන් ගන්න තීන්දුවක් නෙමෙයි.අපි මේ සේවකයින් රැකගන්න ඔන. අවරුදු 04 ක් වෙලා තියෙනවා මේ සභාවේ කිසිම ආදායම උත්පාදන මාර්ගයක් හොයලා නෑ.අපි මේ සම්බන්ධයෙන් කිසිම වැඩ පිළිවෙළකට ගිහින් නෑ සියළුම අනියම් සේවකයින් සතියට දින තුනක් ගෙන්වා ගමු .ඊළග සභාවට ලිවුම ඉදිරිපත් කරන්න.ඉස්සරහට රටේ හොද වාතාවරනයක් ආවොත් නැවත සභාවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගෙන ගෙන්වා ගමු.මේකේ ආදායම් හොයන්න ඕන අපි.වියදම් අඩුකරලා සේවකයින් ගෙන්වා ගැනීම සුදුසු නම්

හොදයි.අතිකාල දෙන්නේ නැතිව මේ අය ගෙන්වා ගමු.ජූනි 01 වෙනිදා සිට මෙය ක්‍රියාත්මක කිරීමට සුදුසු බව මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

සභාවේ සේවකයින්ගේ වගකීම අපිට තමයි තියෙන්නේ පවතින ආර්ථික අර්බුදයත් සමඟ සේවා කාලය දින තුනක් කිරීම නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වය ගෙන යන්නේ කොහොමද මට එක් සේවකයෙක් කිව්වා බැංකු ණයටත් කැපෙන්න පඩිය මදි කියලා අපි මාසයකට දින 05 ක් පමණ අඩු කරලා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.මේ ලබා දෙන සංග්‍රහයත් අපට අවශ්‍ය නෑ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

තිස්ස මන්ත්‍රී තුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක XV**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඩීසල් කාන්දුව

මෙම ලිපියේ රහස්‍යභාවය රකින්න කියලා තාක්ෂිණික නිළධාරී මහතා සටහන් කර තියෙනවා.මේකේ ඇත්තටම වෙලා තියෙන්නේ රෝලේ ඉන්ධන කාන්දුව නිසා තෙල් ටික අයින් කරන්න කියලා තාක්ෂණික නිළධාරී මහතා කියලා තියෙනවා.කාර්යාලයේ යතුර භාවිතා කරලා තෙල් කෑන් 02 ක් ඇතුළට දාලා තියෙනවා මේ තියෙන ගැටළුව නිරාකරණය කරගන්න තමයි මම ලිපිය ඉදිරිපත් කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

රජයේ වාහන භාවිතයේදී නීති රීති පවතිනවා මාස කිහිපයකට කලින් රියදුරු මහතුන් හා සේවකයින් දැනුවත් කලා මින් ඉදිරියට අකටයුත්තක් වෙන්නේ නෑ කියලා කාර්මික කමිටුවත් වගකීම භාර ගත්තා.ලේකම් තුමිය මාර්ගයෙන් වෙන සභාව වලට කතා කරලා වාහන බැහැර යාම් ලේඛණ ගෙන්වා ගත්තා .රියදුරෝ කොච්චර දැනුවත් කරත් බැහැර යාම් ලේඛණය ගිය මාසෙට පස්සේ ලියලා නෑ මේ රියදුරෝ සභාපති තුමාටවත් ලේකම්තුමියටවත් පාලනය කරන්න බෑ.වංචාව නිසා තමයි මේක කරන්න ඇත්තේ.එක් රියදුරු මහත්තයෙක් 252 කැබ්රථයේ දොරෙන් සභාවේ ගේට්ටුව ඇරලා තියෙනවා.සභාවේ වෙන දේවල් ගැන මට නිර්නාමික දුරකතන ඇමතුම් එනවා.තෙල් අර්බුදයක් සමඟ එක් රියදුරු මහත්තයෙක් සභාවෙන් තෙල් බූලී දෙක්ක අරන් ගිහින් තියෙනවා.මේ සභාවේ සියළු වාහන අවභාවිතා කරනවා.අපි මේ සභාවේ සියළු දෙනාට අනුකම්පාව දක්වන්න ඕන වුනාට එයාලා තමයි මේ වගේ වැඩ කරන්නේ.අනුරාධපුරයේ රෝල වැඩ කියලා අපි දන්නෙත් නෑ සේවකයින් කියන්නෙත් නෑ බැහැර යාම් ලියන්නේත් නෑ වැඩ කරන දිනයක සභාවේ ගබඩාවේ ඇතුලේ තිබ්බ බූලී දෙකක් නෑ.රෝලේ අය වැය හදන්න කිව්වා ඒක කමිටුවට දන්නෑ.සභාවට ඉදිරිපත් කරන්නෙත් නෑ.මෙම ඩීසල් අස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවට විමර්ශනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස පමම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - මධුර කුමාර පියරත්න මැතිතුමා**

කාර්මික කමිටු සභාපති තුමා විදියට තිස්ස මවන්ත්‍රී තුමාගේ යෝජනාව නිවැරිදිය.මේ සියළු දෙනාම සභාවට පාලනය කරන්න බෑ.ආයතන සංග්‍රහයට අනුව මේ සේවකයින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි

**ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා**

ඇත්තටම කණගාටුයි.මේකේ අගෞරවය මන්ත්‍රී මණ්ඩලයටත් හිමියි.මේමා ඇත්තටම වෙලා තියෙන්නේ සේවකයින් තරහ විභාගයක් නැතිව බඳවා ගත්තේ නැති එක සුදුසු කෙනා සුදුසු රැකියාවට යොදවා ගත්තේ නැති එක.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

සමහර දේවල්වල තොරතුරු අපට හරියට එන්නේ නෑ මම මේකේ ඇතුළේ සේවකයින් සම්බන්ධයෙන් ලෝකු විශ්වාසයකින් ඉන්නේ.මම මෙතනින් එහාට කිසිම සේවකයෙක් ආරක්ෂා කරන්නෙත් නෑ පෙනී සිටින්නෙත් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා මැතිතුමා.**

මේකේ රියදුරෝ විතරක් නෙමේ සභයට යන අයත් මේ සියළු දේට සම්බන්ධයි.එක පාරක් ටැංකිය ඇරලා ඩීසල් ටික අරන් තියෙන්නේ සභාවේ කුණු එකතු කරන කෙනෙක් මම දැක්ක නිසා මට කිව්වා කරන්න පුලුවන් දෙයක් කරන්න කියලා එක පාරක් මම බැකෝ ලොඩර් යන්ත්‍රය ඉල්ලුවා මට කිව්වා බැකෝ දෙන්න බෑ නට් එක බුරුල් වෙලා ඔයිල් වනලා කියලා.මම බැකෝ එකට නැගලා බලලා නට් එක තද කරා.රියදුරු දන්නෙත් නෑ නට් එක තද කරන්න

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

වාහන ධාවන සටහන් තුලනය කිරීමේදී ටැංකියේ තෙල් යම් ප්‍රමාණයක් ඉතිරි වෙනවා ඒක වාහන අධීක්ෂණය කරන නිළධාරීයාටවත් හොයාගන්න බෑ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

අපි සේවකයින් හැමෝම විශ්වාස කලා අද කියනවා ඔබ තුමාගේ නම්බුව සේවකයෝ නැති කරනවා කියලා මම මින් පසුව සේවකයින් සමබින්ධයෙන් කතා කරන්නේ නෑ.මෙවැනි සේවකයෝ අපට අවශ්‍ය නෑ

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරිම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම යටතේ පහත සඳහන් කමිටු වාර්තා මහ සභාවේ දැන ගැනිම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

- 2022.01.21 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
- 2022.01.27 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව
- 2022.02.08 වන දින පැවති කාර්මක කමිටු වාර්තාව
- 2022.02.10 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
- 2022.03.14 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
- 2022.03.29 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරිම.**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022 මාර්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක - 04-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 මාර්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසිමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.</u>**

කිසිවක් නැත.

**<u>(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ද අවසරයි.අභිනවයෙන් අගමැති ධූරයට පත් වූ ගරු රනිල් වික්‍රම සිංහ මැතිතුමාට මගේ ප්‍රශංසාව මම ප්‍රකාශ කරමි.ඒ වගේම නිසංසලා මන්ත්‍රීතුමිය ළමා හා කාන්තා කමිටුවට වාර දෙකක් සහභාගී වුනේ නෑ

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා මැතිතුමා.</u>**

සභාපති කුමනි උපසභාපති තනතුර පුරප්පාඩු වෙලා තියෙනවා ඒ පිළිබඳව කුමක්ද කරන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

නවවෙනිදා උදේ වුන දේවල් සම්බන්ධවෙන් අපි කනගාටු වෙනවා මේ වෙලාවට රටට නායකයෙක් අවශ්‍යයි.තනිපුද්ගලයා ලෙස එතුමා ඉදිරිපත් වුන එකට මම මගේ ගෞරවය පුද කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාව කියනනේ මහජන නියෝජිත ආයතනයක් මම මේ සම්බන්ධව පෞද්ගලික විරෝධතාවය ප්‍රකාශ කරනවා මේතුලින් වැරදි මතයක් සමාජ ගත වෙනවා.මේකට අතුරු ව්‍යවස්ථාවතක් නොසැදීම සම්බන්ධයෙන් වගකිවයුතු සියළු දෙනාට අප්‍රසාදය පළ කරනවා.මේ නඩුව පැරදුනත් නැතත් අපි ඉදරියට යනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු 16 දෙනෙක් ඉන්නවා........................................

මහජනතාවට අයකරලා දෙන්න ඔන බද්ධක් අයකරලා දෙන්න බැරි නම් ඒ පිළිබඳව අප්‍රසාදය පල කරනවා.නීතිඥ මහතුනගේ උපදෙස් අපට ලබා දෙන්න.අපට අය විය යුතු සම්පත් ගැන කතා කරන්න.ඒවා ලබා ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - රෝහණ විජේතිලක මැතිතුමා</u>**

ඔබ තුමන්ලා දෙදෙනාටම ස්තුතිවන්ත වෙනවා කෝටි ගණන් හම්බ කලාට මේ තීන්දුව සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ලෙස ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

නඩුවට කලින් පළාත් පාලන නියෝජිතයන් ගෙන්වලා අපි මේ පිළිබඳව සාකච්ඡා කරමු.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගී වී සහයෝගය ලබා දුන් සියළුම දෙනාටම ස්තුතිවන්ත වන අතර,අද දින සභාවේ වැඩ කටයුතු හමාර කරනවා.ස්තුතියි.

2022.04.19 වන දින පැවති ගරු මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 12.20 ට පමණ අවසන් විය.

යෝජනා අංක  77 - 04-2022.

ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.

ඇත්තටම මේ සම්බන්ධයෙන් මීට කලින් යෝජනා කලා.සභාවෙන් මෙම කාර්යය හරියටම වුනේ නෑ.නැවතත් අදාල කාරණය සම්බන්ධයෙන් නීතිමය පියවර ඉක්මනින් ගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.

ගරු සභාපතිතුමනි, මා හිතවත් තිස්ස මන්ත්‍රීතුමා කඩකාමර කියනකොට ඒ සියළු කඩකාමර ප්‍රාදේශිය සභාවට අයිතියි. නාවිචාදූව කොට්ඨාසයේ කියනකොට මමයි නාසීම් මන්ත්‍රීතුමයි ඉන්නෙ.නාවිචාදූවේ කඩ කාමර 10 ක් තියෙනවා.මේ වෙන කොට ඉතාමත් දුප්පත් අය තමයි මෙම කඩකාමරවල පදිංචි වෙලා ඉන්නේ.නිවසක් ලෙස තමා භාවිතා කරන්නේ.නව ඉදිකිරීම සිදු කරලා කියන්නනේ රක්ෂිතයේ අපට අයිති කොටසේ.කඩ කාමර ඇතුලේ නව ඉදිකිරිම සිදුවෙනවාද කියලා කියන්න දන්නේ නෑ.ගැහැණු ළමයි ඉන්න නිසා ඉස්සරහා පොඩි අට්ටාලයක් ගහලා ආවරණයක් කරගෙන ජීවත් වෙනවා.ස්ථිරවම කවුරුත් ඉදිකිරිමක් කරලා නෑ.තාප්ප ගහලා නෑ.දැනට තැපැල් කන්තෝරුවත් අපිට අයිති ඉඩමක තියෙන්නේ.ඒක අරගෙන නැවත තැපැල් කන්තෝරුවට දෙමු කියන කාරණය සභාපතිතුමා මතක් කලා.නමුත් මුදල් ගෙවන්න හිඟ තියෙනවා නම් ගරු තිස්ස මන්ත්‍රීතුමා කීවා වගේ සමථ මණ්ඩලයට ගිහින් අපි මුදල අයකරගමු.ඒකට අවශ්‍ය සහනයකුත් දෙන්න ඕන කියලා මම යෝජනා කරනවා.කොහොම හරි ගුටිකන කාලයකුත් ඇවිත් තියෙන්නේ.ඒ මිනිස්සු නැතිබැරිකමට තමා මෙතන ඉන්නේ.නැතිනම් ඔතන ඉන්නේ නෑ.තිස්ස මන්ත්‍රීතුමා මේ වෙනකොට 05 වන අයිතිකාරයා මේකට සම්බන්ධ වෙලා ඉන්නනේ.මේක එක පාරත් ඔයාලා අපි එකතු වෙලා ගිවිසුම්ගත වෙලා අයිති එක්කෙනාට මාස්පතා ගෙවන ගාන දන්වලා තදින්ම අවවාද කලා නියෝග කළා.නමුත් සභාපතිතුමා ආදායම් පරික්ෂක මහතා සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරින් කිහිපදෙනෙකුද මෑතකදි එතනට ගිහිල්ලා තිබුණා.එහෙම ගියපු ගමන්ම එයාලා අපිට කියනවා මෙයාලා අපිට යන්න කියනවා කියලා.අපිට එතකොට සභාපතිතුමාට හරි නිවාස කමිටුවේ සභාපතිතුමාට හරි තමා කියන්න තියෙන්නේ.  ඒ නිසා සභාපතිතුමා මම විශේෂයෙන් කියන්නේ මුදලක් ලබා ගන්න තියෙනවා නම් අපි ඒ මුදල ගන්න ඕන.සභාවට ඒක ආදායම් මාර්ගයක්.මුදල් ලබා ගෙන කවුරුවත් ඒක ගෙදර ගෙනියන්නේ නෑ.සභාව නඩත්තු කරන්න තමා යොදවන්නේ.ඒ නිසා ගරු සභාපතිතුමා අපේ මන්ත්‍රීමන්ලා දෙදෙනෙත් ඉන්නවා නවක මන්ත්‍රීතුමාද  ඉන්නවා.අපි ඔක්කොම නැවත එයාලා එක්ක කථා කරලා මැයි මාසෙ පලමු වෙනිදා වෙනකොට හිඟ මුදල ගෙවිමට අවශ්‍ය පසුබිම සකසා දෙන ලෙස මම ගරු සභාවෙන් ඉල්ලා සිටින අතර ගරු තිස්ස මන්ත්‍රීත්මා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා

ගරු සභාපතිතුමා තිස්ස මනිත්‍රීතුමා කියපු විදිහට නෙවේ මෙතන සිද්ධ වෙලා තියෙන්නනේ.තාප්පයක් නෙවේ බැඳලා තියෙන්නේ.වටේට තහඩු වැට ගහලා තියෙන්නේ.මම හිතන්නනේ තිස්ස මන්ත්‍රීතුමත් දන්නවා ඇති මමත් නිවාස කමිටුවේ ඉන්න කොට ඔබතුමත් මේකට ආවා බලන්න.ඒ වෙලාවෙත් ඒක තිබ්බා. කඩ කාමර 10 ඉන්න ටික දෙනයි මේක කරලා තියෙන්නේ .නමුත් හිඟ  මුදලක් දෙන්න ඇත්තේ මේකේ ඉන්න එක්කෙනෙක්ට හෝ දෙන්නෙක්ට විතරයි. ඊට කලිනුත් මෙහෙම තමයි තිබ්බේ. දුප්පත් අය තමයි එතෙන ඉන්නේ.  නැවත වතාවක් ගෙවන්න තියෙන අයගෙන් හිඟ මුදල් ප්‍රමාණය අය කරගන්න කියලා මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.

මම හිතන්නේ සභාපති තුමා, ඇත්තටම නාසීම් මන්ත්‍රීතුමයි අන්වර් සදාක් මන්ත්‍රී තුමයි ගෙනාවේ හොද යෝජනාවක් ඔබතුමන්ලා මේකට හොද සහයෝගයක් ලබා දෙන්න.මෙතෙනට අපි දහපහලොස් වතාවක් ගිහින් තියෙනවා.කතා කරලා තියෙනවා.මම එක දෙයක් පිළිගන්නවා මේකේ ගෙවන්න බැරි අය ඉන්නවා.මාළු අල්ලන

කෙනෙක් එහෙම ඉන්නවා එයාට ගෙවන්න අපහසුයි.ඇත්තම සභාවට කමිටුවට කියනවා නම් අපි මේ විදියෙන් අය කරලා දෙන්නම් කියලා අපි ඒකට විරුද්ධ වෙන්නේ නෑ. අපිට හැබැයි අය කර ගැනීමට අපහසුකම් තියෙනවා.තමුන්නාන්සේලා දෙන්නට මම මේ කියන්නේ අර අට්ටාලයක් ගහලා තියෙනව කිව්වට අට්ටාලයක් නෙමෙයි ගහලා තියෙන්නේ. හැකියාවක් ඇති කෙනෙක් මේක කරලා තියෙන්නේ හොදට බලන්න එයාලා අපිත් එක්ක තර්ක කලා නිමල් මන්ත්‍රී තුමා සහ රාජකරුණා මන්ත්‍රීතුමා සමග තව අය එදා ගියා එයා කිව්වේ එයාට ඒ කඩ කාමරය අයිති කියලා .අපි කිව්වා ගිවිසුම ගේන්න කියලා.ගිවිසුමේ පළමු හෝ දෙවන පරිච්ඡේදය තියෙනවා සභා අනුමැතියකින් තොරව අලුත්වැඩියා කරන්න බෑ කියලා. ඊට පස්සේ එයා ඒ ගැන කතා කලේ නෑ

අපි හැමදේම කතා කරන කොට පැහැදිලි වෙන්න ඕන.පැහැදිලිව අනවසර ඉදිකිරීම් තියෙනවා.ඔබතුමාලා දෙන්නම මේකට සහාය දෙන්න.ඔබ තුමාලා ගන්න ඕනම තීරණයකට සභාව එකග වෙනවා නමුත් මුදල අය වෙන්න ඕන .හිඟ මුදල් දිගින් දිගටම නොගෙනවන අය ඉන්නවා දැනට තියෙන මුදලට වඩා ලක්ෂ දහයකට වඩා අධික හිඟ මුදලක් තිබ්බා .අපි ගෙවල් වලට ගිහින් කතා කරලා ගොඩක් මුදල් අයකර ගත්තා .කඩ කඩ කාමර ඔබතුමාලා නිර්දේශ කරලා වෙන අය බදු ගත්තා. හැබැයි පුද්ගයන් අදුරන්නේ නෑ. වෙන අය ඉන්නේ .ඒකයි මම දුරකතන අංකය ඉල්ලුවේ කමිටුවේ විදියට කතා කරන්නම් කියලා. ඔබ තුමාලා දුන්න යෝජනාව හොදයි.අපි ලබන පාර කමිටුව තියලා දිනයක් දාගමු. ඔබ තුමාලා දෙන්නත් එන්න .ඒ දහ දෙනත් රැස් කරන්න.සභාවේ නීති රීති වලට එකඟව අපහසු අයට කාලයක් දෙන්න පුලුවන්. අළුවැඩියාවන් කරන්න ඕන නම් සභාවට පිළිගත හැකි නිර්ණායකයන් යටතේ ගරු මහා සභා අනුමැතිය ලබා දෙන්න පුළුවන්. එතකොට එයාලා දන්නවා සභාවට අයිති දේපලක් කියලා. මම වගකීමෙන් කියන්නේ අපි ගිහින් කතාකරනකම් මේ අය දන්නේ නෑ සභාවට අයිති දේපලක් කියලා. දැවැද්දට දුන්නා කියලා ඒ අය අපි ඉදිරියේ ප්‍රකාශ කලා ඒ නිසා ලබන සැරේ අපි දිනයක් දෙනවා මේ ගැන සාකච්ඡා කරමු.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>ලිපි අංක - V</u>

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

තිරප්පෙන් ප්‍රාදේශීය සභාවේ පහත නම් සඳහන් සේවකයන්ගේ 2022 මැයි මාසයට අදාළ අතිකාල දීමනා තක්සේරු වාර්තා අනුමත කර ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

| අනු අංකය | නම | තනතුර | 2022 මැයි මස ඉල්ලුම් කරන අතිකාල පැය ගණන |
|---|---|---|---|
| 01 | එස්.ජී.පී.කාවින්දි මෙය | කළමණාකරණ සේවා නිලධාරි | 30 |
| 02 | ආර්.එම්.කේ.චන්ද්‍රසිරි මෙය | ගිණුම් සහකාර | 40 |
| 03 | අජිත් කුමාර වනසිංහ මයා | මුරකරු | 75 |
| 04 | සී.බී.දිසානායක මයා | මාර්ග කම්කරු | 75 |
| 05 | දිනේෂ් සංජය රුද්‍රිගු මයා | මාර්ග කම්කරු | 75 |
| 06 | ජේ.කුමාරසිංහ මයා | මාර්ග කම්කරු | 75 |
| 07 | ජේ.එස්.ප්‍රියංකර මයා | සෞඛ්‍ය කම්කරු | 75 |
| 08 | එම්.බී.නිජාබ්දීන් මයා | සෞඛ්‍ය කම්කරු | 75 |

**<u>යෝජනා අංක 78 - 04-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

සභාපති තුමනි, අපි දිගින් දිගටම සේවා අවශ්‍යතාවය මත අතිකාල ලබා ගැනීම නිර්දේශ කරලා තියෙනවා. අනිවාර්යෙන්ම සමහර කාර්යයන් තියෙනවා අතිකාල ලබා දීලා කල යුතුම දේවල්. ඒවා අපි කවදාවත් සභාවේ අනුමත නොකර හිටියේ නෑ ඒවා අනුමත කල යුතුමයි.හොඳ යාන්ත්‍රනයක් සහිතව අතිකාල ලබා දෙන්නට ඕන. අනියම් සේවකයෝ ඉන්නවා ඔවුන් යොදවලා හරි අතිකාල සඳහා වැය වන මුදල අඩු කරගන්න යම් ක්‍රමවේදයක් සකසන්න ඕන.පොදුවේ හැමෝටම කියන්නේ වැරදියට තේරුම් ගන්න එපා.අතිකාල දෙන්න එපා කිව්වා කියලා ඕක කියනවා. නරක දේ ඉතාමත් ඉක්මනින් පැතිරෙනවා.හොඳ දේ කවදාවත් කියන්නේ නෑ. අපිට විරුද්ධව පෙළපාලි ගිය මිනිස්සුනේ ඉන්නේ .ඒ නිසා මම ඉල්ලීමක් කරනවා අතිකාල කළමණාකරනය කල යුතුයි. වැඩ නැති අය ඉන්නවානම් ඒ අය මේ සඳහා යොදවලා අතිකාල සඳහා වැය වන මුදල අඩු කරගන්න කියලා.හැබැයි අතිකාල දෙන්න ඕන තැනට දෙන්න.රටේ ආර්ථික තත්ත්වයත් සැලකිල්ලට ගෙන අතිකාල ඉල්ලා ඇති නිළධාරීන්ට මනා කළමණාකරනයකින් යුතුව අතිකාල ලබා දීමට සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VI</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මීළඟට බල ප්‍රදේශයේ බොරළු කැනීම සඳහා ඉල්ලුම් කර තිබූ අත්හිටුවීමට යෝජනා වූ බොරළු වලවල් සංවර්ධන අවශ්‍යතාවය මත නැවත සාකච්ඡාවට භාජනය කිරිම සඳහා සභාවට ඉදිරිපත් කර තිබෙනවා.එය මහ සභාවේ සුදුසු තීරණයක් ගැනිම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

ඇත්තටම අපි බොරළු වලවල් සම්බන්ධයෙන් තිරණයක් ගත්තා බොරළු වලවල් අත්හිටවමු කියන කාරණය. නමුත් බොරළු වලවල් ඉල්ලා ඇති අය විමසීම් කළා බොරළු වලවල් සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා.ඇත්තටම එය හුදෙක් සංවර්ධන අවශතාවය මත පදනම්ව නැවත වතාවක් ඉදිරිපත් කරන්න තීරණය කළේ.මේකට විරුද්ධ අපේ මන්ත්‍රීවරු කිපදෙනෙකු හිටියා. එතුමන්ලා එක්කත් මම සාකච්ඡා කලා.ඇත්තටම මමත් තිස්ස මන්ත්‍රීතුමන් මේ ව්‍යාපෘතියට අනුමැතිය ලබා දිය යුතුය යන තිරණයේ හිටියේ.ඒ වෙලාවෙදිත් ඔබතුමන්ලාගෙන් කිපදෙනෙකු තමා මේකට විරුද්ධ වුනේ.ඒ නිසා නැවත වතාවත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත පදනම්ව, මේ පිළිබඳව සලකා බලා මේ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>යෝජනා අංක 79 - 04-2022.</u>**

**ගරු සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා**

සභාපතිතුමනි,සියළු දෙනාගෙන්ම අවසරයි බොරළු කැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ අදාළ නිළධාරී මහතුන් දැනුවත් කරලා ඒ අදාල කටයුතු ඉදිරියට කර ගෙන යාම සම්බන්ධයෙන් පසුබිම සකසලා දුන්නා .නමුත් ඒ අතරදී ඔබතුමා කීවා වගේ ගරු තිස්ස මන්ත්‍රී තුමා සහ මන්ත්‍රී වරු කිහිප දෙනෙක් කැමැත්ත පල කරත් බහුතර මන්ත්‍රී වරුන්ගේ මතය වුනේ මෙය පරික්ෂා කර බලා අනුමැතිය ලබා දෙන්න ඕන කියලා.නමුත් නීති රීති අනුව නැවත සභාවට ඉදිරිපත් කරන්න මාස හයක් ගත වෙන්න ඕන. නමුත් මෙම වසරේ බොහොමයක් සංවර්ධන කටයුතු සඳහා ගිවිසුම් අත්සන් කරලා මේ වන විට වැඩකටයුතු ආරම්භ කරලා තියෙනවා. නමුත් බොරළු ප්‍රශ්නය නිසා අපේ වසම තියෙන තුලානේ සංවර්ධන කටයුතු නැවතිලා.මේ නිසා ගරු මන්ත්‍රීත්මන්ලා ඔබතුමන්ලා කියන දේ ගැන සාධාරණයක් තියෙනවා. නමුත් සභාපති තුමා ගෙන ආ යෝජනාව අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරන අතර එය ලබා දෙන පුද්ගලයන් ගෙන්වා ගෙන මන්ත්‍රී මණ්ඩලය හමුවේ අපි කතා කිරීම සුදුසු බවට මම ප්‍රකාශ කරමි. ඒ නිසා මෙම වසර සඳහා ඉල්ලා ඇති අය හට මේ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන අතර සියළු මන්ත්‍රී මණ්ඩලයට මේ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු සභික - ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා**

ගරු සභාපති තුමා ඇතුළු සියළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මට මේ සම්බන්ධයෙන් ටිකක් කතා කරන්න ඕන 547 ඉදිගහවැව වගයාකුලම තුලානේ බොරළු කැපීම සම්බන්ධව. මෙය මධුර මන්ත්‍රී තුමත් මමත් තාක්ෂණ නිළධාරීත්, විෂයභාර නිළධාරීත් මෙතනට ගිහින් බැලුවා බලලා අපි බොරළු කැපීම ලබා දීම නුසුදුසු බවට තීරණයක් ගත්තා . මේකේ බොරළු කපන්නේ වැවේ ඉස්මත්තේ .පාරෙන් එහා පැත්තෙනුත් යාබදව කපලා තියෙනවා. එතනෙට බැලුවහම ජේනවා වැවට මොකද වෙන්නේ කියලා . එතකොට මධුර මන්ත්‍රීතුමා මගෙන් ඇහුවා මේක කපනකන් ඇයි බලන් හිටියේ කියලා මොකද ඒකේ වතුර යන්නේ කුඩාගමුව වැවට. දැන් ඒ වැවටත් වතුර යන්නේ නෑ .කොට්ඨාස මන්ත්‍රී තුමා විදියට මම මේකට වග කියන්න ඕන .ඒ නිසා මම ඉදිගහවැව තුලානේ බොරළු වලවල් තුනටම මම ඒකමතිකව විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. සභාවෙන් මේකට අනුමැතිය දෙනවා නම් මොනවා හරි දෙයක් වුනොත් ඒකට ඔබතුමාලා බලාගන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපති තුමා ඇතුළු සියළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි .පොදුවේ ගත්කල රටේ සංවර්ධනය සඳහා වැලි, බොරළු, ගල් වැනි සම්පත් අවශ්‍යයි. ඒ අනුව අන්වර් සදාක් මන්ත්‍රී තුමා කිව්වා වගේ ඒවා ගැන පොදු නිර්ණායකයක් යටතේ තීරණ ගැනීම සුදුසුයි. ඒවට අදාළ නිර්දේශ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන්, ප්‍රාදේශීය සභාවෙන් ,පරිසර අමාත්‍යාංශයෙන් ,පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ,ගොවිජන සේවා කාර්යාලයෙන් ගත යුතුය.හැම ආයතනයකටම එක්දහස් නමසිය ගණන් වලට වඩා පැරණි නීති රීති වලට තමයි අදාල කොන්දේසි දාලා අනුමැතිය දෙන්නේ. මේ කරන අය ඒවා අනුගමනය නොකරන නිසා තමයි මේ ගැටළුව අනිත් අයට බලපාලා තියෙන්නේ .සභාපති තුමත් දන්නවා අනිත් අයත් මම ගිය සැරේ අවස්ථා දෙකේදීම කිව්වේ මේක දෙමු කියලා .ගිය සැරේ සභාව අවසානයේදී අකමැත්තෙන් හෝ මට යෝජනා කරන්න වුනා .එහෙනම් අපි මේ ඔක්කොම නතර කරමු කියලා .ඒ නිසා මගේ පෞද්ගලික මතය අනුව මම මේකට විරුද්ධ වෙනවා. ගියසැරේ ඉදිරිපත් කරලා සභාවෙන් සම්මත කරපු එකක් මාස හයක් යනකම් සභාවට ඉදිරිපත් කරන්න බෑ .ඒක රීතියක්. නමුත් සභාවට පුළුවන් නම් ඒවා යෝජනා සම්මත කරගන්න. එදා විරුද්ධ වෙච්ච මතයට අද හා කියන්න බෑ. අද මහජනතාව රජය හා දේශපාලය කෙරේ තරහකින් වෛරයකින් බලන වෙලාවක් .ආත්මගරුත්වයක් තිබෙන මන්ත්‍රී වරයෙක් විදියට මේකට විරුද්ධත්වය ප්‍රකාශ කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා**

ගරු සභාපති තුමනි, මම හිතන්නනේ මේ බොරළු වලවල් සම්බන්ධව සභා වාර දෙකක් තුළ ගත්ත තීන්දුවක් ආපසු ලබා ගැනීමක්. මේක පරිසර කමිටුවේ සභාපතිතුමත් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා බොරළු වලවල් සම්බන්ධව පවතින නෛතික තත්ත්වය අනුව අනුමැතිය දීම සුදුසු බව.සභාපති තුමනි, බොරළු වලවල් කපලා

අපට රුපියලක්වත් ලැබෙන්නේ නෑ. බොරළු වලවල් සම්බන්ධයෙන් අදාළ ආයතන සියල්ලෙන්ම නිර්දේශ ලබා දී ඇති බැවින්, මම බොරළු වලවල් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම ප්‍රකාශ කරමි. අනුමැතිය ලබා දීම නුසුදුසු නම් ක්ෂේත්‍ර පරික්ෂාව කල නිළධාරීන්ගේ ප්‍රශ්නයක් .විරුද්ධ වන අයට එම නිළධාරියාට විරුද්ධව යම් කිසි පියවරක් ගන්න.එහෙම වුනාට අප ප්‍රදේශයේ ජනතාවගේ සංවර්ධනය කරන පාර නවත්වන්න බෑ. බොරළු වලවල් සම්බන්ධ අනුමැතිය ගරු පරිසර කමිටුවේ සභාපති තුමා ලබා දුන් කොන්දේසී වලට අනුව ලබා දීම සුදුසු බවට මම ප්‍රකාශ කරන අතර ඒ.අන්වර් සදාක් මැතිතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභික- පී. මධුර කුමාර පියරත්න මන්ත්‍රී තුමා</u>**

ගරු සභාපති තුමනි, සියළුම මන්ත්‍රී වරුන්ගෙන් අවසරයි මම ඉස්සෙල්ලාම කියන්න ඕන ගරු සභාපති තුමා කිව්වා සභාපති තුමා ඇතුළු තිස්ස මන්ත්‍රී තුමා මේකට එකහෙලාම කැමති වුනා කියලා.මම කිව්වේ මේකට එකහෙලාම කැමති වෙන්න බෑ කියලා. මේක අවසානයට අනුමැතියට දානවා සභාවට .මම කිව්වේ මේකට අනුමැතිය ලබා දෙන්න බෑ කියලා .මේකේ විමර්ශනයක් කරලා තමයි මම දෙන්නේ කියලා. මමයි තාක්ෂණික නිළධාරී ,විෂය භාර නිළධාරීන් එතෙන්ට බලනකොට ලොකු විනාශයක්. රත්නායක මන්ත්‍රී තුමා කුඩාගම වැව විශාලෙට කපනකම් දැකලා නෑ .දැන් වැවට වතුර යන්නේත නෑ .මන්ත්‍රී තුමා ඒ පැත්තට ගිහිල්ලත් නෑ. මම කිව්වා මම මේකට විරුද්ධයි කියලා. හැබැයි එකපාරටම දෙන්න බැනේ.වගයාකුලම ඉඩම්හිමියෝ මේකට විරුද්ධ වුනේ වැවට වතුර යන්නේ නෑ කියලා. හැබැයි මේ සමබන්ධයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් මීට මාස කිහිපයකට පෙර කොන්දේසී ඇතුළත් කරලා ලිපියක් එවලා තිබුනා උඩ ඉඳන් පහලට කපන්න දෙන්න බෑ කියලා. ඒකෙන් කියන්නේ අඩි දෙකේ මට්ටමට පල්ලෙහා ඉඳන් උඩට කපන් යන්න කියලා අපට පුලුවන් මහජන නියෝජිතයෝ විදියට මහජන විරෝධයක් ගොඩනගන්න. මම කියන්නේ රාජ්‍ය ආයතන අදාල කොන්දේසී වලට යටත්ව මේ සම්බන්ධයෙන් අනුමැතිය ලබා දෙන්න පුලුවන්නම්, අපට මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නෑ .මම කියන්නේ කොන්දේසී වලට යටත්ව අනුමැතිය ලබා දෙන්න කියලා ඒක මගේ පෞද්ගලික අදහසයි.

**<u>ගරු සභික- එච්.බී.නලින් හේරත් මැතිතුමා.</u>**

සභාවෙන් අවසරයි.අපි දන්නවා කවුරුත් බොරළු වලවල් වලින් සල්ලි ගන්නේ නෑ කියලා බොරළු වලවල් සඳහා රාජ්‍ය ආයතන වලින් අනුමැතිය ගන්න ඕන .මගෙත් මිත්‍රයෝත් ඉන්නවා එයාලා මට කියලා තියෙනවා බොරළු වලට අනුමැතිය ගන්න ක්‍රමය මම කියන්නේ නෑ 100% ක් රාජ්‍ය සේවකයෝ දූෂිතයි කියලා. නමුත් කර ගන්න පුළුවන් කෙනා කොහොම හරි කරගන්නවා .අපිට නිළධාරීන්ට විරුද්ධව නඩු දාන්න බෑ .කතා කරන්න තියෙන එකම තැන තමා මෙතන. මේක තනිකරම ජාවාරමක් .රට සංවර්ධනය වෙන්නත් ඕන. බොරළු කැපෙන්නත් ඕන. 2019 ඉඳන් අපි කථා කරන්නේ මේ ක්‍රමය වෙනස් වියයුතුය කියලා.දැන් හොඳටම වෙනස් වෙලා තියෙන්නේ.නිළධාරීන්ගේ අනුමැතිය ලබා ගෙන බලපත්‍රය ලබා ගෙන ව්‍යාපාරයක් කරන්නේ.සමහර අයට ධම්මික පෙරේරාටත් වැඩිය සල්ලි තියෙනවා.මේක අරගොල්ලෝ දුන්නා කියලා දෙන්න ඕන කියලා දෙයක් නෑ. ඒ තත්ත්වයට අපි වැටෙන්න ඕන නෑ. අපි කෙලින් ඉන්න ඕන.මම කොහොමත් මේකට විරුද්ධයි මම යෝජනාත් කරනවා මේකට විරුද්ධයි කියලා.මම කියන්නේ පල්ලෙහා ඉඳන් උඩට එක ගානට කපන්න කියලා ගොවිජන සේවා එකෙන් ලිපියක් එවලා තියෙනවානම් ඒ විදියට කරන්න කියලා .කොහොම හරි පරිසර විනාශයක් නොවන විදියට බොරළු කපන්න ඕන.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අපි මේකට අවසරය දෙනකොට සභා තීරණය දාලා පරිසර බලපත්‍රයේ කොන්දේසී උල්ලංඝනය නොවන ලෙසට පවත්වා ගෙන යාමට සභාවේ එකඟතාවය ලබා දෙන බවට සඳහන් කරනවා. මම කියන්නේ පරිසර කමිටුවේ සභාපති තුමාට එම කොන්දේසී උල්ලංඝනය වන්නේද යන්න නිරීක්ෂණය කරන්න කියලා. රත්නායක මන්ත්‍රීතුමා යම් හෙයකින් එම කොන්දේසී උල්ලංඝනය වන්නේ නම් අපි වහාම නවත්වමු.

**<u>ගරු සභික- ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා</u>**

ගරු සභාපති තුමනි වගයාකුලම ගොවි සංවිධාන විසින් මහජන විරෝධතාවය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලිපියක් භාර දීලා තියෙනවා .එවැනි මහජන විරෝධතාවයක් තියෙද්දි මහජන මන්ත්‍රීවරු වශයෙන් අපි කොහොමද මේකට අවසරය දෙන්නේ. මේ ලියුම එන්නේ අපි ගිහින් බැලුවට පස්සේ.සභාපතිතුමා ,මම මේ බොරළු කැපීම සමබන්ධව එකහෙලාම විරුද්ධයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - රුක්මන් වනසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපති තුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.එතන සභාපති තුමා අදාළ ආයතන වලින් අවසර අරන් කපන්න කියලා නෙමේ කියන්නේ .පරිසරයට දැඩි හානියක් වන විදියට තමයි කපන්නේ. අංක 01 තමා ප්‍රාදේශීය ලෙකම් කාර්යාලයෙන් අනුමත කරන කියුබ් ප්‍රමාණය පමණක් කපන්න අවසර දෙන්න ඕන යන්නම්වාලේ කපන්න දෙන්න හොද නෑ. අංක 02 තමා අපි අනුමැතිය ලබා දුන්නට පස්සේ අනිත් ආයතන වලින් අනුමැතිය ලබා ගන්න ක්‍රමත් ඒ අය දන්නවා. මේක පරිසරයට නිවැරදි කරන්න බැරි වරදක් 2015 වර්ෂයේ ඉදන් හඩනගන්න බැරි මිනිස්සුගෙන් මහජන විරෝධතා එනවා තම්මැන්නාගල නායක හාමුදුරුවෝත් මේ ගැන මා සමඟ කිව්වා. ගරු සභාපති තුමා ඔබ තුමා සමඟත් කියන්න ඇති. ගරු සභාපති තුමනි, ලේකම් තුමියනි නැවත අපි ගිහින් බලමු වගයාකුලම ප්‍රදේශය අවට සිදුවෙලා තියෙන හානිය පිළිබඳව පෙර රජවරු වැව් වලට වතුර යන්න හදාපු ක්‍රම වේදයන් දැන් විකෘති වෙලා තියෙන්නේ. ඒකේ අපවාදය ,ඉදිරියේදී ඔබතුමාට සහ මන්ත්‍රී මණ්ඩයට තමයි එන්නේ මේකට අවසරය දුන්නොත් අපේ ඉදිරි දේශපාලන ජීවිතයටත් බාධා වෙනවා .මේ කටයුත්තට යම් කිසි බොරළු ප්‍රමාණයක් වෙනත් තැනකින් ගන්නවා නම් හොදයි කියන මතය නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් මම යෝජනා කරනවා. මේකට අවසරය දුන්නොත් ඉදිරියේදී සිදු වන හානීය නැවත නිවැරදි කල නොහැකි බව මේ ගරු සභාවට කාරුණිකව දැනුම් දෙමි.ස්තූතියි

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අපි මේ බලපත්‍ර වලට පරිසර කමිටුවේ අධීක්ෂණය යටතේ බොරළු කපා ගන්න අවසරය ලබා දෙමු.ඉදිරියේදී බොරළු සම්බන්ධයෙන් ඉදිරිපත් වන ලිපි වලට කොහාටද කොපමණක්ද ඉල්ලන්නේ කියලා නියාමනයක් තියාගන්න.ඒක පරිසර කමිටුවෙන් කරන්න.

**<u>ගරු සභික- ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා</u>**

සභාපති තුමා මෙතන ප්‍රශ්නයක් තියෙනවා හැබැයි ඕක කපන්න අවරය ලබා දුන්නොත් අධීක්ෂණය කරන්න කෙනෙක් දාන්න.පරිසරයට මොකක් හරි හානියක් වෙනවා නම් ඒ අධීක්ෂණය කරන කෙනා මේකට වග කිවයුතුමයි.අධීක්ෂණය පරිසර කමිටුව හෝ මට හෝ දානවානම් එයා පරිසර හානියට වගකිව යුතුමයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -පී.මධුර කුමාර පියරත්න මැතිතුමා</u>**

රත්නායක මන්ත්‍රී තුමා කියන කතාව හරි වගයාකුලම හරි සංවේදී පරිසර කලාපයක් පස් කපනකොට උඩ ඉදන් පහලට කපන්න එපා ගොවිජන සේවා කොමසාරිස් එවා ඇති ලිපයේ පස් කපන්න අවසරය දෙනවා කියලා නෙම් කියලා තියෙන්නේ.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

නිර්නායක වලට අනුව බොරළු කපන්නේ නැත්නම් ඒක ඒ වෙලාවේම නවත්තමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා</u>**

මන්ත්‍රීවරු සියල්ල කියනදේට අපි එකඟයි. පරිසර හානියක් වෙනවා නම් අපිත් විරුද්ධයි.මේක ගැන තුන්වෙනි වතාවට තමයි කතා කරන්නේ මේකට විසදුමක් දෙන්න කියලා. එක්කෝ දෙනවා නැත්නම් නොදෙනවා කියලා. අනුමත දුන් ආයතන සියල්ල සමඟ සියළු මන්ත්‍රීවරු සහ කොන්ත්‍රාත්කරුවන් එකට වාඩිවෙලා සාකච්ඡා කරමු. අනික කොන්ත්‍රාත්කරුවන් මන්ත්‍රීවරු ලෙස අපිව ගනන්ගන්නේ නෑ ,කතාකරන්න දන්නේ නෑ මධුර මන්ත්‍රීතුමාට

එදා ඒකට තමා තරහ ගියේ. ඒ නිසා සභාපති තුමා අපේ රාමුව තුල ඉදලා පස් කපන්න කියමු.අපි එතෙන්ට ගිහින් අධීක්ෂණය කරලා, ප්‍රශ්නයක් තිබ්බොත් නතර කරමු.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා ඉදිරිපත් වූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ බහුතර එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - VII**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කඩ කාමර බදු දිම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ තිරණයක් ගැනිම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 80 - 04-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා**

ගරු සභාපති තුමනි අලුතින් ඉදි කරන කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන මුදලට කඩ කාමර බදු දීමට සුදුසු බව මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපති තුමනි සුසන්ත මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරිම**.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම යටතේ පහත සඳහන් කමිටු වාර්තා මහ සභාවේ දැන ගැනිම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

- 2022.01.21 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
- 2022.01.27 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව
- 2022.02.08 වන දින පැවති කාර්මක කමිටු වාර්තාව
- 2022.02.10 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
- 2022.03.14 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
- 2022.03.29 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරිම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 මාර්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 81 - 04-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 මාර්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී. මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන්* 2022 මාර්තු මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13)*පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඍ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.</u>**

කිසිවක් නැත.

**<u>(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

වෙනත් අදහස් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි ,වෙනත් අදහස් ලෙස නවක මන්ත්‍රීතුමා ලෙස තේරී පත්වූ මගේ හිතවත් අප සියළු දෙනා හොඳින් දන්නා වනසිංහ මන්ත්‍රීතුමා සාදරයෙන් පිළිගනිමි.විශේෂයෙන්ම මධුර මන්ත්‍රී තුමා තමයි වනසිංහ මන්ත්‍රී තුමා ගැන නිතරම කියන්නේ.

ඒ වගේම මම කියන්නනේ මෙම වසරේ අප්‍රේල් තුන්වෙනිදා වෙනකොට ප්‍රාදේශීය සභාවේ වසර හතරක ධූර කාලයක් අවසන් වෙලාවේ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත තවත් අවුරුද්දක් දීර්ඝ කිරීම මත වනසිංහ මැතිතුමාට ලැබුනු භාග්‍යක් ලෙස මම හිතනවා.මට නම් හදිස්සියේ අපේ ගම් ප්‍රදේශයේ බයික් එකේ පැච් කක් ගියත් බය වෙන්න දෙයක් නෑ. නාසීම් මන්ත්‍රීතුමාගේ හෝ වනසිංහ මන්ත්‍රීතුමාගේ වාහනේ හරි යන්න පුළුවන්. ගමේ අපි කුමන දේශපාලන පක්ෂක හිටියත් සභාවේ මන්ත්‍රී වරු විදියට එකතුවෙලා කටයුතු කරන්න ඕන. එතුමා අපි අතර ඉන්න බුද්ධිමත් කෙනෙක්. අපි හැමදාම සහෝදරයෝ වගේ ඔබතුමාට ලැබුනු කාලය තුල මහජනතාව වෙනුවෙන් ඔබතුමාට කල හැකි උපරිම සේවය ඉටු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි මම ප්‍රාර්ථනා කරමි.ඒ වගේම සභාවටත් ඔබතුමාගේ සහයෝගය ලැබේ යයි විශ්වාසය මත ඔබ තුමාට නැවත නැවත ස්තුතිය

පුද කරමි. ඒවගේම දැනට දින කිහිපයකට පෙර අපේ සහෝදර ජනතාවගේ අලුත් අවුරුදු උත්සවය අවසන් වුනා. මධුර මන්ත්‍රීතුමා මට අවුරුදු ගෙනත් දුන්නා. එතුමාට ඒ සඳහාත් ස්තුතිය පුද කරමි.

රටේ දැනට උද්ගතව පවතින අර්බුද හමුවේ මේ සියළු දෙනාම එකම සමාජයක සහෝදරයෝ වගේ ජීවත් වෙන්න ඕන කියන පණිවිඩය සියළු දෙනාටම ලබා දෙමි.ඒ වගේම මේ අවුරුද්දේ අපිත් එක්ක හිටපු කීප දෙනෙක් අපි අතර නෑ. ලබන වසර වෙනකොට මොනවා වෙයිද දන්නෑ .මේ සභාවේ මන්ත්‍රී වරු විදියට කාලයට වෙලාවට දේශපාලනය කලාට දොරෙන් එලියට යනකොට අපි සියළු දෙනාගේ සහෝදරකම රැකගන්න ඕන.ඔබ සියළුදෙනාටම උදා වූ සිංහල හින්දු අවුරුද්ද සාමයෙන් සතුටින් පිරි සුහම සුභ අළුත් අවුරුද්දක් වේවායි මම ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම මමයි නාසීම් මන්ත්‍රී තුමා ගිය සභාවේදී ඉල්ලීමක් කලා. අපේ අවුරුදු ලබන මාසේ තුන්වෙනිදා නිසාත් ,මේ කාලේ අපි නෝම්බි අල්ලන නිසාත් ,අපේ කාන්තා පාර්ශවය සහ වැඩිහිටියන් රාත්‍රී කාලයේ පල්ලියට යන නිසා අපේ පැත්තේ තියෙන අබලන් වීථි ලාම්පු සකසා දෙන්න කියලා.ගිය සභාවේදී මේ පිළිබඳව යෝජනා කල නිසා මාසයක් තිස්සේ බලන් හිටියාට වීථි ලාම්පු පිළිසකර කලේ නෑ. ඒ නිසා මේ වීථි ලාම්පු කඩිනමින් සකස් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, මිනිස්සු ගැවසෙන තුන්මන් හංදි වල සවි කර ඇති වීථි ලාම්පු කඩිනමින් අළුත්වැඩියා කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි

ඒ වගේම සභාපතිතුමා, නාච්චාදූව පොදු වැසිකිලිය සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන්න ඕන. දොරවල් දෙකම ගැලවිලා තියෙන නිසා එලියේ ඉන්න කෙනා දොර අල්ලන් ඉන්න ඕන. මම හැමදාම මේ ගැන සභාවේ කතා කරනවා . කීප දෙනෙක් හදන්න ආවත් මේක හදලා තියෙන්නේ ඔය විදියටමයි.ඒ නිසා සභාපති තුමා මෙම වැසිකිලි දොරවල් ඉතා කඩිනමින් සකස් කරදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර ගරු සභාපති තුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ටත් මන්ත්‍රීවරියන්ටත් නවක මන්ත්‍රීතුමාටත් ලැබුවාවූ නව වසර සුහම සුභ නව වසරක් වේවායි ප්‍රර්ථනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී තුමනි, ෆස්මි මන්ත්‍රී තුමා දීර්ඝ කථාවක් කල නිසා මම වැඩිදුර කතා කරන්න අදහස් කරන්නේ නෑ. ඒ නිසා නවක මන්ත්‍රී ලෙස තේරී පත්වූ ,දීර්ඝ කාලයක් දේශපාලනයේ යෙදී සිටින වනසිංහ මැතිතුමාට සියළු දෙනා වෙනුවෙන් සුභාසිංශන පිරිනමමි.ඒ වගේම තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් සේවය කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායී ප්‍රාර්ථනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී. මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි තිරප්පනේ ප්‍රාදේශිය සභාවේ නවක මන්ත්‍රීතුමෙක් ලෙස තේරි පත්වූ දිර්ඝ කාලයක් තිස්සේ මා හොඳින් දන්නා වනසිංහ මැතිතුමාට මගේ සුභාසිංශන පතමි.ඒ වගේම ගරු සභාපති තුමාටත් මන්ත්‍රී මණ්ඩලයටත් උදා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් මගේ දුරකතන අක්‍රීය වුන නිසා සුභ පතන්න නොහැකි වුනා.ඒ අනුව ඒ සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරනවා. මෙම අවස්ථාවේදී සියළු දෙනාට උදා වූ සිංහල හා හින්දූ අලුත් අවුරුද්ද සුභ අලුත් අවුරුද්දක් වේවායි මම ප්‍රර්ථනා කරමි.

වර්ථමානය වන විට අපේ රටේ තෙල් මිළ, බඩු මිළ ඉහල යන නිසා ජනතාව ඉතා පීඩනයෙන් ජීවත් වෙනවා. අද වන විට ගෝල්ෆේස් පිට්ටනියේ පක්ෂ භේදයකින් තොරව මුළු රටම "ගෝඨාගෝහෝම්" යන ආදර්ශ පාඨයත් සමඟ පෙළ ගැසී සිටිනවා. හැමෝම කියන්නේ ගෝල්ෆේස් ගිහිල්ලා මේ මහජන අරගලයට සම්බන්ධ වෙමු කියලා.අද මුළු 225 ම එපා කියලා තමා ජනතාව කියන්නේ. ඒක ප්‍රාදේශීය සභාවද පලාත් සභාවද කියලා අදාළ නෑ.මේ සමාජ විද්‍යාව තුල දේශපාලනය කරන්න ඕන සමාජය තුළ ඉඳලා. වැරදුනොත් ඉදිරි බලපෑම් දීර්ඝකාලීනයි.අද වෙනකොට තත්ත්වය තීව්‍ර වෙලා තියෙනවා. 2026 වෙනකම් මෙම තත්ත්වය තියෙයි කියලා ආර්ථික විශේෂඥයින් කියනවා.මමත් පිරවුම් හලේ ඊයේ රෑත් හිටියා, අද උදේත් හිටියා තෙල් ටික නෑ.අද ළමුන්ට අධ්‍යාපන කටයුතු කරන්න පාසලට යන්න පවා අපහසු වෙලා තියෙනවා. ඒ නිසා මේ රටේ පාලකයන්ට, පළාත් පාලන නියෝජිතයන්ට ප්‍රඥාව පහල වී මේ රට තිබ්බ තැනින් හොඳ තැනට ගන්න අවබෝධය ලැබේ යයි මම ප්‍රාර්ථනා කරනවා.

අවසාන වශයෙන් කියනවා නම් සිරිමාවෝ මැතිණිය ඉන්න කාලේ හොද නිෂ්පාදන ආර්ථිකයක් තිබ්බා. කර්මාන්ත තිස්දෙකක් තිබ්බා .කඩදාසි, සිමෙන්ති ,උදළු තල ,යූරියා වැනි දෑ ස්ථාපනය කලා. ඒක පුද්ගල ආදායම ඉහල තලයක තිබ්බේ.සිංගප්පූරුව අපේ රට දිහා බලලා සිංගප්පූරුව ලංකාව වගේ කලා .අවසාන වශයෙන් කියන්නේ සිංගප්පූරුව හැදුනේ විගණනය අංක එකට තියලා .ඒ නිසා අපේ රටෙත් අංක එකත් විගණනය දෙකත් විගණනය අංක තුනත් විගණනය වෙන්න ඕන. හෙට නූපන් දරුවන්ටද හොද රටක් තියන්න ඕන. ඒ වගේම, මේ රටේ මහජන දේපල සොරා කන දේශපාලකයන්ට හෙන ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -නාසීම් මන්ත්‍රී තුමා</u>

ගරු සභාපති තුමනි, මා හිතවත් මන්ත්‍රීවරු සියළුදෙනාගෙන් අවසරයි.විශේෂයෙන් අද මා හට විශේෂ අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබා ලැබීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමි.එමෙන්ම ලැබුවා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සියළු දෙනාටම සුභම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනාකරමි.එමෙන්ම එක්සත් ජාතික පක්ෂ නව මන්ත්‍රී ධූරය සඳහා තිරප්පනේ ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වූ මා මිත්‍ර සහෝදර ගරු. රුක්මන් වනසිංහ මැතිතුමාට අද පටන් ඉදිරි දේශපාලන ගමන ශක්තිමත්ව කර ගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු පස්දෙනෙක් ඉන්නවා .අපි සියළු දෙනා ඉදිරි දේශපාලන ජීවිතයේ එකට එක්ව කටයුතු කරමු .පක්ෂය තුළ අපි එකට ඉන්න ඕන.ඒ වගේම හිටපු උපසභාපති තුමා අපට ලොකු ශක්තියක් දුන්නා .අපි ඒ කාලේ සභාවේ හිටියේ නෑ .නමුත් එතුමා තනියෙන් ඉදගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවිධානය කරගෙන හිටියා.ගරු සභපතිතුමා ඒ ගැන හොඳින් දන්නවා.දවසක් මට රෑ වෙලා කථා කරනවා ,විපක්ෂයේ ඉන්න කාලයේ මෙතන කොඩි අදින්න තියෙනවා, රැස්වීම් කරන්න තියෙනවා එන්න කියලා. මම එතකොට දේශපාලනයේ හිටියා. අපි එදා විශ්වාසයෙන් කටයුතු කලා .ඒ වෙලාවේ විපක්ෂයේ ඉන්න කොට කිසිදු ප්‍රශ්නයක් නෑ. ඒ විශ්වාසය අපි ඉදිරියටත් රැගෙන යමු. ඒ වගේම අන්වර් සදාක් මැතිතුමා කතා කල විදියට වීථි ලාම්පු සම්බන්ධව මම තමයි පළමුව යෝජනා කළේ. කාලවෙලාව බාධා වන නිසා ඒක කරගන්න බැරි වුනා.එබැවින් අඩුම ගානේ හංදි වලවත් වීථි ලාම්පු අළුත්වැඩියා කර දෙන ලෙස මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා.ගරුසභාපති තුමනි, ඉදිරියේදී අපේ ගරු මධුර මන්ත්‍රීතුමා කතා කල විදියට රටේ ප්‍රශ්නයක් තිබෙනවා. අපි සියළු දෙනා ඒකට අහුම්කන් දිය යුතුයි.නමුත් ඒකට අපිට කිසිම ප්‍රතිචාරයක් දක්වන්න බෑ.ඒ නිසා අපේ පුංචි පාර්ලිමේන්තුව ඇතුලේ එක්ව කටයුතු කිරීම සඳහා ශක්තිය ධෛර්යය ලැබෙන්න ඕන කියන ප්‍රාර්ථනාව තමා කරන්න ඕන.මම නිහඩ වෙනවා ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - නිමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා</u>

ගරු සභාපති තුමනි,සියළු දෙනාගෙන්ම අවසරයි .මට ප්‍රශ්න දෙකයි කතා කරන්න තියෙන්නේ.මීට පෙර මම සභාවට පැමිණි අවස්ථාවේදී කුට්ටිකුලම පොදු ක්‍රීඩා පිටිය අසල තිබෙන ගව ගාල පිළිබඳ කතා කළා. මම පරිසර කමිටුවේ ඉන්න කාලේ මම යෝජනා කලා, මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන්ටත් කිව්වා, ඒක තාම විසදිලා නෑ. මම පරිසර කමිටුවේ සභාපතිතුමාගෙනුත් සභාවේ ගරු සභාපතිතුමාගෙනුත් ඉල්ලනවා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියාලා. අනිත් කාරණය තමයි අපේ එක්කෙනෙක්ගේ කුඹුරට බලහත්කාරයෙන් හරක් දාගෙන ඉන්නවා. ඒ ඉඩමේ බලපත්‍රයේ අනවසර කියලා තියෙන්නේ ගව ගාල තියෙන ඒවා ඔක්කොම හේදිලා යන්නේ ඔයට. පල්ලෙහා මිනිස්සු නාන්නෙත් ඒකෙන්. නමුත් මහජන සෞඛ්‍ය පරික්ෂක මහත්වරුන්ට සහ වනජීවී කාර්යාලට කිව්වට තාම මේ කාරණය විසඳුනේ නෑ. මම පරිසර කමිටුවේ සභාපති තුමාට මේ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ප්‍රාදේශීය ලේකම් තුමියට කිව්වහම ඒක බලන්න ගියේ ග්‍රාම නිළධාරී සහ ජනපද නිළධාරී දෙන්නා තමයි .ඒ දෙන්නා එතනට ගියාට ප්‍රාදේශීය ලේකම් එනවා කිව්වට ප්‍රාදේශීය ලේකම් ආවේ නෑ. ඒ වෙලාවේ ජනපද නිළධාරී හරක් ගාල් හිමියා සමඟ කතා කරලා ගිහින් තිබුනා මේක එක මනුෂ්‍යයෙක්ගේ ප්‍රශ්නයක් තියෙන්නේ.අනික් කාරණය තමයි ගොවි සංවිධාන ඉල්ලීමක් කරලා තියෙනවා සංවර්ධන ව්‍යාපෘති වල ඇස්තමේන්තු සකස් කිරීමේදී සිංහලයට පරිවර්තනය කරලා දෙන්න කියලා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, ජනතාව මෙම ආර්ථික අපහසුතාවයට මුහුණ දීලා ඉන්න වෙලාවක නවක මන්ත්‍රීතුමෙක් ලෙස තේරී පත්වූ වනසිංහ මැතිතුමාට සුභපතනවා.අපේ කොට්ඨාශයේ අබලන් වීථි ලාම්පු වගයක් තියෙනවා ඒවා අළුත්වැඩියා කරන ලෙස ඉල්ලා සිටිනවා.ඒ වගේම කට්ටමුරිච්චාන සෝලයන්කුලම පැත්තේ පාරක් හදනවා. ඒකෙ පාර මැද මාස දෙක තුනක් තිස්සේ බොරළු ගොඩ ගහලා තියෙන්නේ .මිනිස්සු කුඹුරුවලට යන්නේ මේ පාරෙන්. ඒක තුනී කරලා දුන්නා නම් ප්‍රශ්නය විසඳෙනවා. ඒවගේම පාරේ දාලා තිනේනේ බොරලු නෙවේ ගල් කැට. ඒ පිලිබඳව මහජනතාව විරෝධය පළ කරලා ප්‍රාදේශීය සභාවට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. පිළිබඳවද අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

ඒකට විරෝධතා ලිපියක් අත්සන් කරලා භාර දෙන්න.

__ගරු ප්‍රාදේශීය සභා සභික - පී ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා මැතිතුමා.__

සියළුදෙනාගෙන්ම අවසරයි .පළමුව තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ නවක මන්ත්‍රී ලෙස තේරී පත්වූ රුක්මන් මන්ත්‍රී තුමාට මගේ ප්‍රණාමය පුද කරමි. ඒ වගේම ගිය සභා වාරයේදීත් මම මතක් කළා ඉදිගහවැව තම්මැන්නගල පාරේ මේ දවස්වල යන්නම බෑ. පුළුවන්නම් මෝටර් ග්‍රේටරයක් දාලා හරි පාර හදන්න.මේක බොරළු අදින පාර වශයෙන් තමයි භාවිත කරන්නේ.බොරළු ඇදලා දැන් යන්නම බෑ වෙල්මුදාවේ අය තම්මැන්නාගල පන්සලට යන්නේ ඔය පාරෙන් .ඒ ප්‍රදේශයේ අලි ඉන්න නිසා පාරේ හෙමිහිට යන්න ඕන .එක්කෝ ඒ මිනිසුන්ට අලියෙක් ගහනවා ,නැතිනම් වලකට වැටෙනවා.අපි ඔය පාර බොරළු අදින්න බද්දක් අය කරනවා ,එම මුදලින් හරි ඔය පාර මෝටර් ග්‍රේටර් කරලා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

පාර කොච්චර දුරද?

__ගරු ප්‍රාදේශීය සභා සභික - පී ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා මැතිතුමා.__

කි.මී.එකක් හෝ එකහමාරක් පමණ තියෙනවා සභාපතිතුමා.

__ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.බී.නලින් හේරත් මැතිතුමා මැතිතුමා මැතිතුමා.__

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසරයි.වසර හතරක පසුව තිරප්පනේ ප්‍රාදේශීය සභාවට නවක මන්ත්‍රී වරයෙකු වශයෙන් තේරී පත් වූ ගරු රුක්මන් වනසිංහ මැතිතුමාට මගේ සුභාසිංශන පිරිනමනවා.දිගින් දිගටම අප සමඟ වැඩකිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

ගරු සභාපතිතුමනි, කඩ කාමර බදු දෙන විට අපි ඉල්ලුම් පත්‍රයක් දෙනවාද ,එයාලා ඉල්ලීමක් කරනවාද , කාල සීමාවක් තියෙනවාද?

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

ඉල්ලීමක් කරන්න කියන්න.ඒකට කාලසීමාවක් තාම නෑ.

__ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.බී.නලින් හේරත් මැතිතුමා.__

එහෙමනම් හැමෝටම සුභ අනාගතයක් කියලා මම ප්‍රාර්ථනා කරනවා.

__ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.__

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ද අවසරයි. සියළු දෙනාට සුභ අළුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අපට මෙතන ලොකු අඩුවක් දැනෙනවා විෂය භාර නිළධාරී කටයුතු කළ කේ.බී.අක්ෂිලා

සුජීවනී බණ්ඩාර මිය අසනීප තත්ත්වයෙන් පසුවන නිසා එතුමියට ඉක්මනින් සුවය ලැබිලා ඉක්මනින් සභා වාර වලට සහභාගී වෙන්න අවස්ථාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

සියළු දෙනාගෙන්ම අවසරයි .සියළුම දෙනාට සුභ අළුත් අවරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.මෙම ප්‍රාදේශීය සභාවේ උපසභාපති ලෙස කටයුතු කල වයි.එම්.තවුපික් මැතිතුමාගේ අභාවය නිසා පුරප්පාඩු වූ මන්ත්‍රී ආසනයට තේරී පත්වූ ගරු රුක්මන් වනංසිංහ මැතිතුමා ආදරයෙන් පිළිගන්නවා .ඒ වගේම එතුමාට ඉදිරි දේශපාලන ජීවිතය ජනතාවට සේවය කිරීම සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම මේ අවස්ථාවේදි සභාවක් විදියට පැමිණෙන අභියෝග වලට සාර්ථකව මුහුණ දීමට සහයෝගය අවශ්‍යයි.

සභාපතිතුමා මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා .මම ඒක ඉදිරිපත් කරනවාද නැද්ද කියලා කල්පනා කරල මේ කියන්නේ. සභාපතිතුමාට මතක ඇති එක පාරක් අපි ඔබතුමාව සම්බන්ධ කරගෙන උට්ටිමඩුව පෙර පාසලට මුදල් වගයක් හම්බුනා. ඒ සල්ලි දැන් ඇවිදින් තියෙන්නේ.පොඩි ගැටළුවක් තිසා ඒ වැඩසටහන ක්‍රියාත්මක කිරිමට නොහැකි වෙලා තියෙනවා. ඒ පෙර පාසල් භූමිය ලැබිලා තියෙන්නෙ ප්‍රදානයක් විදියට.මුදල් දෙන්න නම් අදාළ ආයතනය ඔප්පුව ඉල්ලනවා .දැනට එම ඉඩම ප්‍රදානය කරපු කෙනා ජීවතුන් අතර නැ. එයාගේ මල්ලී තමයි ජීවතුන් අතර ඉන්නේ. ඒ නිසා එම සංවර්ධන යෝජනාව නැවතිලා තියෙනවා.මම ඔබ තුමාගෙන් ඉල්ලනවා ඒ අදාල ආයතන දැනුවත් කරලා මේ සම්බන්ධයෙන් විසඳුමක් ලබා දෙන්න කියලා මොකද ඒක එතෙන්ට අත්‍යවශ්‍ය කාරණයක්. පෙර පාසල පාර අයිනේ තියෙන නිසා එතනට ආරක්ෂිත ගේට්ටුවක් තිබීමත් අත්‍යවශ්‍ය වෙනවා.එබැවින් මේ පිළිබඳව සොයා බලා විසඳුමක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - රුක්මන් වනසිංහ මැතිතුමා.**

හැමෝගෙන්ම අවසරයි.මට ඉස්සෙල්ලාම මතක්වෙන්නේ එක්සත් ජාතික පක්ෂයට දැවැන්ත ශක්තියක් වූ හිටපු උපසභාපති තුමා.එත්සත් ජාතික පක්ෂය ඉතාමත් දුර්වලව පැවති සමයක එතුමා ලොකු සහයෝගයක් ලබා දුන්නා. මගේ දේශපාලන සගයාගේ මියගිය යාම සම්බන්ධව මම කණගාටුව ප්‍රකාශ කරනවා .තිරප්පනේ ප්‍රාදේශිය සභාවට මම ප්‍රථමයෙන්ම පැමිණි දවසේ එළාර දුටුගැමුණු කාලය ඉඳලා ඉතිහාසය බැලුවොත්, මේ ප්‍රදේශයට අයිති උරුමක්කාරයෙකුගේ ඉගංම්වරුන්ගෙන් පැවත එන ගරු සභාපතිතුමා යටතේත්, ඒ වගේම මහජන නියෝජිතයන් නොමැති සමයක මෙම ප්‍රාදේශිය සභාවේ මහජන සුභ සිද්ධිය සම්බන්ධව කටයුතු කළ ජ්‍යෙෂ්ඨ පරිපාලන අපේ ලේකම්තුමිය යටතේත් ඒ වගේම 1978 ජේ.ආර්.ජයවර්ධන මැත්තුමාගේ 6 න් 5 ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් වූ ගරු වලගම්බාහු මැතිතුමාගේ ඥාතියෙකු සිටින අවස්ථාවක ,ඒ වගේම ගරුවරයෙක් වන මගේ කුඩා කල මිත්‍රයා ඒ වගේම, 1988 දේශපාලනයට එනකොට ශාඛා සමිතියේ ගරු භාණ්ඩාගාරික මහත්තයාගේ පුත්‍රයාත්, ඒ වගේම 1988 එක්සත් ජතික පක්ෂයන් පෝලිම් බූට් එකට යද්දී එතන කොලේ පුරවලා දුන්න ඉස්මයිල් මහත්තයාගේ මල්ලිත්, ඒ වගේම මගේ කොට්ඨාසයේ මාත් සමඟ එදිරිවාදිව තරඟ කළ ගරු මන්ත්‍රීත්මන්ලාත්, නාච්චාදූව කොට්ඨාසයේ මගේ ඡන්ද වමම දාලා ඇවිත් සෙලෙස්තිමඩුව ඡන්ද ලබා දුන් නාසිම් මන්ත්‍රීත්මාත් ,අපි කුලකයක් ලෙස අපේ 05 දෙනෙක් ඉන්නවා. ඇත්තටම රටේ තියෙන තත්ත්වයත් එක්ක මේ සභාවට ආවට පස්සේ මට හිතුනා පක්ෂ විපක්ෂ නෑ ,අපි ඔක්කොම මහජනතාව කියලා.1981 අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ මිහිකත සුරැකිමේ පාරිසරික සංවිධානය ආරම්භ කරමින් පරිසරයට මෙහෙවරක් කරන්න ඉදිරිපත් වුනු සාමාජිකයෙක් වශයෙන් මෙතන මට ඉන්න පුළුවන් තැනක් කියන එක වෙන ප්‍රාදේශිය සභාවලට සාපේක්ෂව මම හැඟුනා.

ඒ වගේම ඉදිරියේදි කටයුතු කරද්දී රටේ අර්බුදයක් පවතින අවස්ථාවක කල් ඉකුත් වූ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීධුරයක් ලැබීම කැස්සට කල්ඉකුත් වූ පැණියක් බීම යැයි මට සිතේ . කැස්ස හින්දා බොන්නත් ඕන, විසිකරන්නත් බෑ.මේක ඇත්තටම මොන විදියට ලැබුනද කියලා මට හිතාගන්න බෑ. නැත්නම් මේ වගේ මන්ත්‍රීධුර හම්බ වෙන්නෙනෑ. මම ඒ කාලේ මනාපයක් දුන්න මන්ත්‍රීවරයෙකුත් මෙතන ඉන්නවා. ඒ වගේ සුහදශීලී හමුවීමකින් සහයෝගයකින් අපි වැඩ කරන්න ඕන.1985 අංක 14 දරණ ප්‍රාදේශීය සභා පනතේ සංශෝධනයකින් මෙතුමාට බලය තියෙන ,මෙතුමියට බලය තියෙන, අපටත් යම් කිසි තැනක් තියෙන තතත්වයට පත්වෙලා තියෙන්නේ .ඒ වගේම පොදු ප්‍රවාහන ,මං මාවත් ,මාතෘ වැඩසටහන් ,වලට වගේම මී උණ හැදිලා අපේ ගම්

ප්‍රදේශයේ කවුරු හරි මැරුණොත් අපිත් ඒවට වගකියන්න ඕන.ඒ නිසා මේ ඉන්න කාලය ජනාධිපති තුමා විසුරුවයිද දන්නේත් නෑ. ආයේ ඡන්දයකට යන්න වෙයිද දන්නේත් නෑ. අපිට ආයේ හම්බෙන්න පුලුවන් වෙයිද දන්නේත් නෑ. ඒ වගේම මා මේ තැනට පත් කරපු පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, පක්ෂ මහලේකම් ගරු පාලිත රංගේ බණ්ඩාර මැතිතුමාටත් ,අනුරාධපුර දිස්ත්‍රික් නායක අනුරාධනායක මහතා ඇතුළු අපේ පක්ෂයේ සියළු දෙනාටත් මම ස්තූති වන්ත වෙනවා. ඒවගේම ලංකාවේ සියළු ප්‍රාදේශීය සභා වල මන්ත්‍රී වරු සමඟි ජන බලවේගයට යද්දි එක්සත් ජාතික පක්ෂයේ අපි පස්දෙනා තවම පක්ෂයේ සිටීම සම්බන්ධයෙන් අපේ නායකතුමාගේ වාසනාවක්දෝ යයි මට හැගෙනවා. මෙතන අපි පස් දෙනාම එකට ඇවිත් ඉන්නවා .අනිත් ප්‍රාදේශීය සභා වල ගැටන්නේ අනිත් පක්ෂ සමඟ නෙමෙයි සමඟි ජන බලවේගයයි, එක්සත් ජාතික පක්ෂයයි. නමුත් මෙතන තත්ත්වය අනුව නාසිම් මන්ත්‍රීතුමාත් ,අනිත් මන්ත්‍රීතුමත්ලාත් ,මාත් ,ගරු සභාපතිතුමා ගන්න තිරණයකට සාමූහිකව එකඟ විය හැකි තත්ත්වයක් පවතින බැවින් මම සතුටු වන අතර ,මම නිහඬ වෙමි.ස්තූතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>

මට වෙනත් යෝජනා යටතේ අදහසක් තිබ්බා ඒකට මට පොඩි කාලයක් දෙන්න.මේ සභාවේ සේවය කළ කේ.බී.අක්ෂිලා සූජීවනී මහත්මිය අපේ සභාවේ කටයුතු වලට විශාල සහයෝගයක් ලබා දුන්නා. එතුමිය මේ අවස්ථාවේදී අසනීප තත්ත්වයෙන් පසුවන්නේ.උණක් හෙම්බිරිසාවක් වගේ නෙමේ බරපතල අසනීප තත්වයක්. ඒ නිසා අපේ සභාවේ සුභ සාධක සමිතියෙන් අපේ ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා එතුමියට සහයෝගයක් ලබා දෙන්න කියලා. මම හිතන්නේ නදී මන්ත්‍රීතුමියත් මතක් කලා එතුමියටත් ස්තූති පුද කරනවා. මම හිතන්නේ අපේ ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා අසනීප වුන වෙලාවක තමයි අපි මනුස්සයෙකුට උදව් කරන්න ඕන.වැටෙන වෙලාවක තමයි එයාව උස්සලා ගන්න ඕන.අපේ පුලුවන් ශක්තියෙන් අපි එයාට සහයෝගය ලබා දෙනවා නම් අවසාන වශයෙන් මනස හරි නිරවුල් කරගන්න පුලුවන්.මම හිතන්නේ එක එන්නතකට රුපියල් හැටදාහක් පමණ වියදම් වෙනවා. එවැනි එන්නත් හයක් විදින්න ඕන.මේ සම්බන්ධයෙන් සභාවට ලිපියක් දැමීම සම්බන්ධයෙන් මම සතුටු වෙනවා.අපේ ගරු මන්ත්‍රී මණ්ඩලය තමන්ගේ හදවතට සාක්ෂි දරණ මේ මොහොතේ රුපියල් 5000.00 ක මුදලක් ලබා දීමට පොරොන්දු වෙලා තියෙනවා.ඒ නිසා සභාපති තුමා ලබන මාසයේ අපේ මන්ත්‍රී දීමනාවෙන් මෙම මුදල අඩු කරගෙන එම මුදල අදාල නිළධාරිනියට ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.එතුමියට ඉතා කෙටි කාලයකින් අසනීප තත්වය සුව වී නැවත සේවය කිරීමට අවස්ථාව ලැබේ යැයි මා ප්‍රාර්ථනා කරනවා. හැමෝම වෙලාවක් තියෙන වෙලාවට බලන්න යන්න.සමහර අය දන්නෙත් නැතිව ඇති, සමහර අය දන්නවත් ඇති. නමුත් දූරකථන ඇමතුමක් හරි දීලා එයාගෙ දුක සැප අහන්න. එතුමියට සුව වෙන්න කියලා අපි හැමෝම ප්‍රාර්ථනා කරමු.මේ මුදල් අපි 5000.00 ක් දැම්මට සමහර අයට පුළුවන් ඊට වඩා වැඩි මුදලක් දෙන්න.අපේ සභාවේ උත්සවයක් තිබ්බ වෙලාවක නලින් මන්ත්‍රීතුමා ළමයෙකුට ලැප් ටොප් පරිගනකයක් ලබා දුන්නා. මම ඒ පිළිබඳව සතුටු වෙනවා.ඒ නිසා මේ අවස්ථාවේදී ඇයට හැකි අයුරින් සහයෝගය පළ කරන ලෙස මම ඉල්ලා සිටිමි.

ඒ වගේම සභාපතිතුමා නාසිම් මන්ත්‍රීතුමා හදාපු පාරක පිටිපස්ස සම්බන්ධයෙන් මම හැමදාම මේ ගැන කථා කරනවා.තරහ වෙන්න එපා මන්ත්‍රිතුමා, අඩි 1 ½ ක් මගේ ගේ ඇතුලේ වතුර.ළමයින්ට නිදාගන්න තැනක් නෑ.එක තැනක වතුර ඇවිත් අනිත් ගෙදරට ගියාම එතනටත් වතුර එනවා.ඒ නිසා නාසිම් මන්ත්‍රීතුමා මේ සඳහා පොඩි කානු පද්ධතියක් හදලා දුන්නා නම් බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. ඒ නිසා ඉතා කඩිනමින් මෙය සකස් කර දෙන ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිමි.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගී වී සහයෝගය ලබා දුන් සියළුම දෙනාටම ස්තූතිවන්ත වන අතර,අද දින සභාවේ වැඩ කටයුතු හමාර කරනවා.ස්තූතියි.

2022.04.19 වන දින පැවති ගරු මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 12.20 ට පමණ අවසන් විය.